# 3. කෘෂිකර්මය, ධීවර සහ වන සම්පත්

## 3.1 නිෂ්පාදන උපනති

සමස්ත කෘෂිකාර්මික නිමවුම 1998 දී සියයට 2.5 කින් වර්ධනය වූ අතර එය 1997 දී සියයට 3 ක් විය. කෘෂිකාර්මික නිමවුමේ ඉහළ වර්ධනය සඳහා දායක වූයේ සියයට 20 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගිය වී සහ වාර්තාගත ඉහළ නිෂ්පාදන මට්ටමක වූ තේ යන නිශ්පාදන අංශයන්ය. වී නිෂ්පාදනයේ ඉහළ යාම සඳහා වපුරන ලද බිම් ප්‍රමාණය ඉහළ යාම මෙන්ම ඵලදාව වැඩි දියුණු වීම ද දායක විය. පසුගිය වර්ෂ 5 තුලදී අඛණ්ඩ වර්ධනයක් අත්කරගත් තේ නිෂ්පාදනය පෙර වර්ෂයේ ඉහළ නිෂ්පාදනයට වඩා සියයට එකකින් වැඩි වීමෙන් වර්ෂය තුලදී නව ඉහළ මට්ටමක් වාර්තා කළේය. වර්ෂයේ පළමු භාගය තුළ තේ මිල ගණන් යහපත් තත්ත්වයේ පැවැතුනි. රුසියානු රූබල් අර්බුදය සහ කෙන්යාව වැනි රටවල නිෂ්පාදනය ඉහළ යාමෙන් ලෝක තේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම නිසා වසරේ අවසාන භාගය තුල මිල ගණන් පහත වැටීම ආරම්භ විය. ප්‍රධාන වශයෙන්, ආකර්ශණීය නොවන මිල ගණන් හේතුවෙන් රබර් නිෂ්පාදනය සියයට 9 කින් පහත වැටුණි. එමෙන්ම 1997 දී වූ 'එල්නීනෝ' සංසිද්ධියේ පසුකාලීන බලපෑම යටතේ පොල් නිෂ්පාදනයෙහි සියයට 3 ක පහත වැටීමක් වාර්තා විය. ගම්මිරිස්, කොකෝවා, කෝපි, කරදමුංගු, සාදික්කා සහ කුරුඳු තෙල් නිෂ්පාදනය ඉහළ යාමත් සමහම අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. හිතකර මිල ගණන් මෙම බෝග සඳහා වාසිදායක වූයේය. අනෙකුත් ක්ෂේත්‍ර බෝග අතුරින් උඳු, මුං ඇට, කව්පී සහ සෝයා බෝංචි නිෂ්පාදනය ඉහළ ගියේය. කෘෂි භාණ්ඩ සම්බන්ධ වෙළෙඳ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ලිහිල් කිරීමෙන් පසු ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙන් කරන ලද ආනයන සමඟ සාපේක්ෂ ඉහළ නිෂ්පාදන පිරිවැයක් සහිත දේශීය නිෂ්පාදකයාට එම ආනයන සමග තරඟ කිරීමට නොහැකි වූ බැවින් මිරිස්, රතු ළූණු, ලොකු ළූණු සහ අර්තාපල් වැනි ඉහළ අගයකින් යුත් බෝග නිෂ්පාදනය ඉතාමත් පහළ මට්ටමකට වැටුණි. විශේෂයෙන් මිරිදිය ධීවර අංශය වැඩි දියුණු වීමේ හේතුවෙන් වර්ෂය තුළදී ධීවර නිෂ්පාදනය සියයට 8 කින් ඉහළ ගියේය. එමෙන්ම 1998 දී පශු සම්පත් අංශයද වැඩි දියුණු වීමක් පෙන්නුම් කළේය.

**3.1 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සහ මිල වෙනස්වීම්**

| අයිතමය | ඒකකය | නිෂ්පාදනය | | වෙනස්වීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | | 1997 | 1998 | නිෂ්පාදනය | මිල |
| තේ | කි.ග්‍රෑ.දශලක්ෂ | 277 | 280 | 1 | 13 |
| රබර් | කි.ග්‍රෑ.දශලක්ෂ | 106 | 96 | -9 | -12 |
| පොල් | ගෙඩි දශලක්ෂ | 2,631 | 2,547 | -3 | 8 |
| වී | මෙ.ටො. දහස් | 2,239 | 2,692 | 20 | -7 |
| සීනි | මෙ.ටො. දහස් | 63 | 61 | -3 | -3 |
| මත්ස්‍ය | මෙ.ටො. දහස් | 240 | 260 | 8 | -2 |

මූලයන් : අදාළ ආයතන<br>ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2 කෘෂිකාර්මික ප්‍රතිපත්තිය

1995 දී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ සඳහන් වූ ප්‍රතිපත්ති වලට අදලව වැවිලි නොවන කෘෂිකාර්මික අංශය සම්බන්ධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය. එම ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගුණාත්මක වශයෙන් ඉහළ බීජ සහ රෝපණ ද්‍රව්‍ය සැපයුම, කෘෂි ව්‍යාප්ති සේවා ක්‍රමවත් කිරීම සහ කෘෂිකාර්මික අංශය දියුණු කිරීම සඳහා පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් ඒකාබද්ධ ප්‍රවේශයක් ඇති කිරීම අවධාරණය කර ඇති අතර රාජ්‍ය අංශය ඉහත ප්‍රතිපත්තිමය අරමුණු ළඟා කර ගැනීමේලා උපකාරක කාර්ය භාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගුණාත්මක වශයෙන් ඉහළ බීජ සැපයුම සඳහා හිඟුරක්ගොඩ බීජ ගොවිපොල 1998 දී පෞද්ගලිකකරණය කරනු ලැබීය. ජාතික බීජ සහ රෝපණ ද්‍රව්‍ය කමිටුව විසින් 'බීජ ද්‍රව්‍ය සඳහා පණතක් දැනටමත් සකස් කර ඇති අතර එය ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම කමිටුව 1998 දී පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් සඳහා බීජ නිෂ්පාදන පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

වැවිලි අංශය තුල 1995 දී ආරම්භ කරන ලද ප්‍රාදේශීය වැවිලි සමාගම් පෞද්ගලීකරණය 1998 දී තවදුරටත් ක්‍රියාත්මක විය. බලන්ගොඩ වැවිලි සමාගමේ කොටස් වලින් සියයට 39 ක් වර්ෂය තුළදී කොළඹ කොටස් වෙළෙඳපොළ මඟින් මහජනතාවට අලෙවි කරනු ලැබීය. (කොටස් වලින් සියයට 20 ක් කොටසක් රුපියල් 20 බැගින් සහ ඉතිරි සියයට 19 කොටසක් රුපියල් 61 බැගින්). මේ අතර වෙනත් වැවිලි සමාගම් 4 ක කොටස් වලින් සියයට 20 ක් ද මහජනතාවට අලෙවි කරනු ලැබීය. එම වැවිලි සමාගම් නම් මඩොල්සිම (කොටසක් රුපියල් 15 බැගින්), හපුගස්තැන්න (කොටසක් රුපියල් 10 බැගින්), කහවත්ත (කොටසක් රුපියල් 10 බැගින්) සහ උඩපුස්සැල්ලාව (කොටසක් රුපියල් 10 බැගින්) වේ. මෙයට අමතරව වටවල වැවිලි සමාගම (කොටසක් රුපියල් 60.75 බැගින්) සහ මස්කෙලිය වැවිලි සමාගම (කොටසක් රුපියල් 45 බැගින්) සිය කොටස් වලින් සියයට 15 ක් කොළඹ කොටස් වෙළෙඳපොළ මඟින් මහජනතාවට අලෙවි කර ඇත. වර්ෂයේ පළමු භාගය තුල තේ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම සහ දෙවන භාගය තුලදී පහත වැටීම වැවිලි සමාගම්වල කොටස් මිල කෙරේ බලපෑමක් ඇති කළේය.

බොහෝ රටවල කාර්මීකරණය සඳහා පූර්ව අවශ්‍යතාවයක් වූයේ ඉහළ මට්ටමින් වාණිජකරණය වූ කෘෂිකාර්මික අංශයේ දිගුකාලීන හා චිරස්ථායී සංවර්ධනයයි. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මැදිහත්වීම ඉහළ මට්ටමකින් වූ දේශීය කෘෂිකාර්මික අංශය තුල එවැන්නක් සිදු නොවීය. වී ගොවීන්ගේ මූර්ත ආදායම් ක්‍රමිකව පහත වැටී ඇත. සාමාන්‍ය පාරිභෝගික මිල සහ ශ්‍රමයද ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් පිරිවැය ඉහළ ගිය ප්‍රමාණයට වඩා අඩු වර්ධන අනුපාතිකයකින් නිෂ්පාදක මිල ඉහළ ගොස් ඇත. පසුගිය වසර 5-6 කාලය තුලදී වී වගා අංශයෙහි සමහර

ශ්‍රමිකයන්ගේ මූර්ත වැටුප් සියයට 1-2 ප්‍රමාණයකින් පහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රමය කෘෂිකර්මයෙන් පිටතට ඇදී යාමක් සිදු වී තිබේ. එහෙත් ඊට අනුරූපව කෘෂිකාර්මික ඵලදායීතාවයේ වැඩි දියුණු වීමක් සිදු නොවීය. මේ හැර රැකියා සඳහා කාන්තාවන් විශාල වශයෙන් දිවයිනෙන් බැහැර යෑම, පැල සිටුවීම, වල්පැල නෙලීම සහ අස්වනු නෙලීම ආදී කෘෂිකාර්මික කටයුතු කෙරේ බලපා ඇති අතර නිෂ්පාදනයේ ඵලදායිතාවය පහළ වැටීමටද හේතු වී ඇත. ශ්‍රමිකයන් රටින් බැහැරව යාම එම අංශයේ වැටුප් ඉහළ යාම සඳහාද බලපා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාව වී සහ අනිකුත් කෘෂිකාර්මික භාණ්ඩ නිපදවීම සඳහා ඉහළ පිරිවැයක් දරණ රටක් බවට පත් වී ඇති අතර එය සමහර කෘෂිකාර්මික භාණ්ඩවල තරඟකාරී භාවය අඩු කිරීමට හේතු වී ඇත. වර්තමාන කෘෂිකාර්මික ශ්‍රම සැපයුමේ ඌණතාවය සහ ජනගහනය වයස්ගත වීමෙන් එම ගැටලුව උග්‍රවීම යන ප්‍රශ්න වලට මුහුණ දීම සඳහා කෘෂිකාර්මික කටයුතු වඩාත් යාන්ත්‍රීකරණය කිරීම මගින් ශ්‍රමය ඉතිරි කිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීම අවශ්‍ය වේ. කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය සඳහා වාණිජමය අරමුණු මුල් කරගත් පෞද්ගලික අංශයේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වේ. මේ ආකාරයේ සංවර්ධනයක් සඳහා පවතින ප්‍රධාන සංරෝධකය වන්නේ කෘෂිකාර්මික ඉඩම් අධික ලෙස කැබලි වී යාමයි. දනට වී වගා කරන ඉඩම් කැබලි වලින් සියයට 90 කට වැඩි ප්‍රමාණයක් ප්‍රමාණයෙන් හෙක්ටයාර දෙකකට වඩා අඩු ඒවා වේ. එවැනි කුඩා ඉඩම් කැබලි වගා කිරීම යාන්ත්‍රිකකරණය කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවේ. යාන්ත්‍රික කෘෂිකර්මය කෙරේ උනන්දු කිරීම සඳහා ඉඩම් ඒකරාශී කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. කුඩා ඉඩම් කැබලි ඵලදායී ප්‍රමාණයට ඒකරාශී කිරීම ආර්ථික වශයෙන් වැදගත් අතර එය කාර්යක්ෂමතාවය සහ නිමවුම වර්ධනයටද සුළු ගොවීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වීමටද හේතු විය හැකිය. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රිදීබැඳි ඇල සහ චන්ද්‍රිකා වැව වාරිමාර්ග යෝජනා ක්‍රමවල 1997 දී සිට ආරම්භ කරනු ලැබූ ඉඩම් ඒකරාශී කිරීමේ ව්‍යාපෘතිය 1998 දී ද ක්‍රියාත්මක විය.

අර්තාපල්, ළූණු, සහ මිරිස් සඳහා වූ ප්‍රමාණාත්මක ආනයන පාලනයන් (බලපත්‍ර අවශ්‍යතා) ඉවත් කරන තෙක් කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්තියක් නොවීය. මෙම ප්‍රතිපත්ති අනුව බලපත්‍ර අවශ්‍යතා මගින් ආනයන පාලනය කිරීම පාරිභෝගිකයන් විශාල ප්‍රමාණයකට අවාසි දයක වූ අතර එමගින් ගොවීන් ආරක්ෂා කරනු ලැබීය. මෙම ක්‍රමයෙන් බැහැරව, වර්තමාන තීරු බදු ව්‍යුහය යටතේ උපරිම තීරුබදු පැනවීම මගින් කෘෂිකාර්මික අංශය සඳහා ආරක්ෂණය ලබාදී ඇත. 1998 අයවැය මගින් බීජ නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා සානුබල සපයා ඇත. කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා යොදාගත යුතු බීජ වර්ග දේශීය නිෂ්පාදන දියුණු කිරීමෙන් හෝ ආනයනය මගින් ලබාගත හැකි බව පැහැදිලිව අවබෝධකර ගෙන ඇත.

## 3.3 අපනයන භෝග

### තේ

පසුගිය වසර කීපය තුල පැවැති තේ නිෂ්පාදනය ඉහළ යාමේ නැඹුරුව 1998 වසර තුළදීද දක්නට ලැබුණි. නොකඩවා පස් වෙනි වසරටත් තේ නිෂ්පාදනය නව ඉහළ මට්ටමක් කරා ළඟාවූ අතර පසුගිය වසරට වඩා සියයට 1 කින් වැඩි වී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 280 ක් විය. උස් හා මැදි බිම්වල තේ නිෂ්පාදනයෙහි අඩුවීමක් තිබියදීත් ළඟා කරගත් මෙම වාර්තාගත නිෂ්පාදනයට මුළුමණින්ම දයක වූයේ පහතරට ප්‍රදේශවල තේ නිෂ්පාදනයේ වූ වර්ධනයයි. වසර පුරාම හොඳින් පැතිරී පැවතුනු වර්ෂාපතනය සහ වසරේ පළමු භාගය තුළදී පැවති ආකර්ශණීය මිල ගණන් හේතුවෙන් වැඩි වශයෙන් පොහොර භාවිතයට නැඹුරු වීමද යන මේ සාධක සියල්ල නිෂ්පාදනයේ වර්ධනයට දයක විය. වසරේ මුල් භාගයේදී ආකර්ෂණීය මට්ටමක තිබුණු තේ මිල ඉන්දියාව සහ කෙන්යාව වැනි රටවල තේ සැපයුම වැඩි වීම සහ රුසියානු රූබලය අර්බුදයට පත්වීම නිසා වසරේ අග භාගයේදී පහත වැටුණි. පසුගිය වසර තුන තුළදී රුසියාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මුළු තේ අපනයනයෙන් සියයට 20 කට දයක විය. 1997 දී රුසියාවට කෙලින්ම අපනයනය කරන ලද තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 49 ක් වූ අතර, 1998 දී එය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 38 දක්වා පහත වැටුණි.

තේ නිෂ්පාදනයේ වැඩි වීමට හේතු වූයේ පහත් උන්නතාංශ බිම් ප්‍රදේශ වල නිෂ්පාදනයයි. 1997 දී " එල් නීනෝ " සංසිද්ධිය හේතුවෙන් පසුබෑමකට ලක් වූ පහතරට ප්‍රදේශවල තේ නිෂ්පාදනය 1998 සියයට 11 කින් වැඩි වී වාර්තාගත අස්වැන්නක් වූ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 150 ක් විය. මෙය මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 54 ක් විය. මේ අතරතුර, පසුගිය වසරේ වර්ධනයක් පෙන්වූ මැදි බිම් සහ උස් බිම් තේ නිෂ්පාදනය පසුබෑමකට ලක් විය. 1997 වසර හා සැසඳීමේදී උස් බිම් තේ නිෂ්පාදනය හා මැදි බිම් තේ නිෂ්පාදනය පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 6 කින් පහත වැටුණි.

කුඩා වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය තවදුරටත් ඉහළ යාමක් වාර්තා කළ අතර, එය 1998 දී සියයට 11 කින් වැඩි විය. 1997 වසර තුළදී කුඩා වතු හිමියන්ගේ නිෂ්පාදනය දේශීය තේ නිෂ්පාදනයෙන් සියයට 54 කට දයක වූ අතර, මෙය 1998 දී තවදුරටත් ඉහළ යමින් සියයට 61 ක් විය. කුඩා වතු අංශයේ සාමාන්‍ය ඵලදාව 1998 දී සියයට 11 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,192 ක් විය. මේ අතරතුර වතු අංශයේ ඵලදාව අසතුටුදයක මට්ටමක නොවෙනස්ව රැදී පැවතුණි. එය කුඩා වතු අංශයේ ඵලදාවෙන් අඩක් (සියයට 48) පමණ වේ.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය තේ ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,559 විය. මෙය අනිකුත් තරඟකාරී රටවල් හා සැසඳීමේදී ඉතා පහළ මට්ටමකි. කෙන්යාවේ සහ ඉන්දියාවේ සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,284 හා හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,850 වේ. වතු අංශයේ අඩු ඵලදාවට හේතු වූයේ එම තේ වගාවන් විශාල වශයෙන් අඩු ඵලදාවක් දෙන බීජ මගින් රෝපනය කරන ලද වගාවන් වීමය. කුඩා වතු හිමියන්ගේ වගාවන් සියයට 100 ක්ම වාගේ වැඩි ඵලදාවක් දෙන වැඩි දියුණු කල රිකිලි තේ වගාවන් වේ. පහළ මිල ගණන් පවතින අවස්ථාවලදීද තේ කර්මාන්තය එලෙසම තරඟකාරී ලෙස පවත්වාගෙන යාමට නම් එහි ඵලදාව වැඩි කළයුතු වේ. ඵලදාව වර්ධනය කර ගැනීමට නම් විශේෂයෙන් වතු සමාගම් අඩු ඵලදාවක් දෙන බීජ මගින් රෝපනය කල තේ වෙනුවට රිකිලි තේ වර්ග වගාකළ යුතු වේ.

**3.2 සංඛ්‍යා සටහන**
**තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| | අයිතමය | ඒකකය | 1996 | 1997(අ) | 1998 (ආ) |
|---|---|---|---|---|---|
| 1. | නිෂ්පාදනය | කි.ග්‍රෑ.දශ ලක්ෂ | 258 | 277 | 280 |
| | උස් බිම් | කි.ග්‍රෑ.දශ ලක්ෂ | 72 | 84 | 76 |
| | මැදි බිම් | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 48 | 57 | 54 |
| | පහත් බිම් | කි.ග්‍රෑ.දශ ලක්ෂ | 138 | 136 | 150 |
| 2. | බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| | මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 189 | 194 | 195 |
| | දළු කැඩීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | 174 | 177 | 180 |
| 3. | පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 154 | 160 | 182 |
| 4. | නැවත වගා කිරීම | හෙක්ටයාර | 937 | 931 | 1,239 |
| 5. | අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 479 | 327 | 411 |
| 6. | මිල | | | | |
| | කොළඹ | කි.ග්‍රෑ./රුපියල් | 103.88 | 119.40 | 134.35 |
| | අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 139.56 | 158.39 | 184.94 |
| 7. | නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ./රුපියල් | 87.04 | 93.47 | 106.72 |
| 8. | අපනයන | කි.ග්‍රෑ.දශලක්ෂ | 244 | 269 | 272 |
| 9. | අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 34,068 | 42,533 | 50,280 |
| | | එ.ජ.ඩොලර් දශලක්ෂ | 615 | 719 | 780 |
| 10. | එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) | | 2.2 | 2.3 | 2.6 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) තේ කොමසාරිස් අංශය මගින් 1994/95 වර්ෂයන්හිදී කරන ලද සමීක්ෂණයක දත්ත මත පදනම් වේ. (අත් හරින ලද තේ ඉඩම් ඇතුලත් නොවේ.)
(ඈ) වගා කිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.


මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය.
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව.

1995 සිට තේ වගා අංශයේ පොහොර භාවිතය වැඩි වීමක් පෙන්නුම් කරයි. 1998 වසර තුළදී භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 12 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 181,800 විය. පොහොර ණය ක්‍රමය යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් බෙදා හරින ලද පොහොර ප්‍රමාණය 1997 දී සියයට 60 කින් වැඩි වූ අතර, එය 1998 දී සියයට 9 කින් තවදුරටත් වැඩිවිය.

1995 වසරේ අග භාගයේදී සිට ඉහළ යන ප්‍රවනතාවක් පෙන්වූ තේ මිල 1998 අගෝස්තු මාසය තෙක් ඉහළ ගියේය. ඉන්පසු මිල ගණන් පහත වැටුන අතර 1998 අගෝස්තු මාසයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 136.52 ක් වූ සාමාන්‍ය මිල 1998 දෙසැම්බර් වනවිට කිලෝග්‍රෑමයකට රුපියල් 117.47 ක් දක්වා පහත වැටුණි. රුසියාවේ ආර්ථික අර්බුදය නිසා රුසියාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවිය. 1997 වසරේදී උග්‍ර නියඟයකට මුහුණ දුන් කෙන්යාවේ තේ නිෂ්පාදනය සියයට 30 කින් වැඩිවීම හේතුවෙන් ලෝක තේ සැපයුම ඉහළ ගිය අතර ඉන්දියාවේද තේ නිෂ්පාදනය ඉහළ යාම ලෝක තේ මිල පහල වැටීම කෙරෙහි බලපෑවේය. කෙසේ වෙතත්, කොළඹ වෙන්දේසියේ සියළුම තේ සඳහා වාර්ෂික සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිල සියයට 13 කින් ඉහළ ගිය අතර මෙය රුපියල් වශයෙන් බලන කල වාර්තාගත මිලක් වූ කිලෝ ග්‍රෑමයකට රුපියල් 134.55 ක් විය. මෙම ඉහළ මිල ගණන් වලට හේතු වූයේ වර්ෂයේ ප්‍රථම භාගයේ පැවැති ඉතාමත් යහපත් මිල ගණන්ය. වාර්ෂික සාමාන්‍ය අපනයන මිලද සියයට 17 කින් වැඩි වී වාර්තාගත මිලක් වූ කිලෝ ග්‍රෑමයකට රුපියල් 184.94 ක් බවට පත්විය.

තේ අපනයන ප්‍රමාණය සියයට 1 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 272 ක් විය. මේ සමඟම හොඳ මිල ගණන් ද පැවතීම නිසා අපනයන ඉපයීම් සියයට 18 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 50,300 ලෙස වාර්තා විය. නොකඩවා තෙවන වසරටත් නිදහස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ශ්‍රී ලංකාවේ තේ සඳහා විශාලම ගැණුම්කරු වූ අතර, එම රටවල් මුළු තේ අපනයන ප්‍රමාණයෙන් සියයට 16 කට දයක විය. ප්‍රධාන ගැණුම්කරුවන් තිදෙනා වූ නිදහස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ තුර්කිය වෙත අපනයන කරන ලද ප්‍රමාණය මුළු තේ අපනයනයෙන් සියයට 40 ක් පමණ විය.

**3.1 රූප සටහන**
**මිල සහ පිරිවැය පිළිබඳ දර්ශක: තේ**
**(1990 - 100)**




ශ්‍රී ලංකාවේ තේ වගා අංශය තවමත් ව්‍යුහාත්මක ප්‍රශ්න කීපයකට මුහුණ දෙයි. වේගයෙන් ඉහළ යන නිෂ්පාදන

පිරිවැය 1998 වසරේදී ද ගැටලුවක් විය. රජයට අයත් තේ වතුවල සහ වැවිලි සමාගම් 21 සාමාන්‍ය බර තබන ලද නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑමයකට රුපියල් 106.72 ක් දක්වා ඉහළ ගියේය. මෙය සියයට 14 ක වර්ධනයකි. දෛනික වේතනය රුපියල් 83 (සහ උපරිම මිල ප්‍රසාද දීමනාව වූ රුපියල් 10) සිට රුපියල් 101 (දෛනික වේතනය රුපියල් 95 සහ රුපියල් 6 මිල ප්‍රසාද දීමනා ඇතුළුව) දක්වා ඉහළ යාම නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු විය. නිෂ්පාදන පිරිවැයේ ශ්‍රම වියදම තවදුරටත් ඉහළ යමින් මුළු පිරිවැයෙන් සියයට 66 ක් විය. එය 1997 දී සියයට 59 කි. කොළඹ වෙන්දේසියේ තේ සඳහා ගෙවන මිල හා සම්බන්ධ කර ඇති බැවින් අමු තේ දළු සඳහා ගෙවන මිලද ඉහළ ගියේය.

අනිකුත් ප්‍රධාන තේ නිපදවන රටවල් සමඟ සැසඳීමේදී ලංකාවේ තේ නිෂ්පාදනයෙහි එකතු කල අගය (value addition) වැඩි වුවත් තවමත් විශාල තේ ප්‍රමාණයක් තොග වශයෙන් අපනයනය කරනු ලැබේ. 1998 දී තොග වශයෙන් අපනයනය කල තේ ප්‍රමාණය මුළු තේ අපනයනයෙන් සියයට 59 ක් විය. තේ වගාව පිළිබඳ වසර 130 කට වැඩි පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකාව තේ අලෙවිය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් පෙන්නුම් කල බවක් පෙනෙන්නට නැත. දනට ලංකාව සතුව ජාත්‍යන්තර වෙළෙඳපොළේ දේශීය වෙළඳනාමයෙන් ජනප්‍රිය තේ වර්ග දෙකක් පමණක් තිබීමෙන් මෙය සනාථ වේ. එබැවින් ජාත්‍යන්තර තරඟකාරී වාතාවරණයකට මුහුණ දෙමින් ශ්‍රී ලංකාවේ තේ වෙළඳනාමයන් ජනප්‍රිය කරවීම කෙරෙහි උත්සුක වීම අවශ්‍යය.

තේ නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය පසුගිය වසර කීපය තුළ අඩු වීමක් පෙන්වයි. තේවලට හොඳ මිලක් පවතින අවස්ථාවකදී නැවත වගාව සඳහා ගස් ගැලවීමේදී සිදු වන ආදායම අහිමි වීම සහ නැවත වගා කිරීමේ සහනාධාරය ප්‍රමාණවත් නොවීම ඊට හේතු වී ඇත. තේ නැවත වගා කිරීම වැඩි කිරීම සඳහා දිරි දීමක් වශයෙන් 1998 ජූලි පළමුවනදා සිට 'නැවත වගා කිරීමේ සහනාධාරය' වැඩි කරන ලදී. අවුරුදු 3 ට පසුව, උස් හා මැදි බිම් ප්‍රදේශවල නැවත වගා කිරීමේ සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 67,000 සිට රුපියල් 110,000 දක්වාද, පහතරට ප්‍රදේශවල හෙක්ටයාරයකට රුපියල් 57,000 සිට රුපියල් 100,000 දක්වාද වැඩි කරන ලදී. වසර තුළදී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 635 ක් වූ අතර, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් ඒ සඳහා ගෙවන ලද සහනාධාර ප්‍රමාණය ඉකුත් වසරේ වාර්තාවූ රුපියල් දශ ලක්ෂ 30 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 58 දක්වා ඉහළ ගියේය.

නව තේ වගාව සඳහා දෙනු ලබන සහනාධාරය පසුගිය වසර හතර තුළ නොවෙනස්ව පැවතුණි. එය තේ බිම් උන්නතාංශ තුන සඳහාම හෙක්ටයාරයකට රුපියල් 36,000 විය. වසර තුළදී නව වගාවට යොමු වූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 381 ක් වූ අතර ඒ වෙනුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ගෙවන ලද සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 19.2 ක් විය. මෙයට අමතරව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් කුඩා වතු හිමියන්ගේ උන්නතිය සඳහා පහත සඳහන් කටයුතු ඉටු කරන ලදී. විශේෂ යෙදවුම් සහනාධාර ක්‍රමය, උපදේශක සහ ව්‍යාප්ති සේවාවන්, පොහොර ණය ක්‍රමය සහ "තේ ශක්ති" නම් වූ විශේෂ ඉතිරි කිරීම් ආයෝජන රක්ෂණ ක්‍රමය ඒ අතර වේ. කුඩා වතු හිමියන් සඳහා 1997 දී "තේ ශක්ති" යෝජනා ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය.1998 අවසානයේදී මෙම ක්‍රමයට බැඳී සිටි සාමාජික සංඛ්‍යාව 77,899 ක් වූ අතර, 1997 බැඳී සිටි සාමාජික සංඛ්‍යාව 55,648 කි. "තේ ශක්ති" අරමුදලේ ඇති මුදල් සහ 1998 අයවැයෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ප්‍රදානය කරන ලද විශේෂිත වෙන් කිරීම් උපයෝගී කොටගෙන කුඩා වැවිලිකරුවන්ගේ සමාගම් අතර විශේෂ ණය ක්‍රමයක් යටතේ තේ දළු ප්‍රවාහනය සඳහා වාහන 100 ක් බෙද හරින ලදී.

පුද්ගලික තේ කම්හල් හිමියන් සහ වැවිලි සමාගම් විසින් 1998 වසර තුළදී තේවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම උදෙසා වර්ණ විභේදක (colour seperators) 60 ක් මිලදීගෙන ඇත. තේ සඳහා වසරේ පළමු භාගය තුල පැවැති හොඳ මිල ගණන් හේතුවෙන් කර්මාන්තශාලා හිමියන් හට මෙම ආයෝජනයන් කිරීමට හැකි විය.

විශේෂයෙන් පහතරට තේ කර්මාන්තය විශාල ශ්‍රම හිඟයකට මුහුණ පාමින් සිටී. මෙයට මුහුණ දීම සඳහා තේ පර්යේෂණායතනය මඟින් මෑතකදී අතින් දළු නෙලීම වෙනුවට දළු නෙලීමේ උපකරණයක් හඳුන්වා දෙන ලදී. මෙම දළු නෙලීමේ උපකරණය විශේෂයෙන් ශ්‍රම හිඟය උග්‍ර ප්‍රදේශවල ජනප්‍රිය වෙමින් පවතී. තේ පර්යේෂණායතනයට අනුව මෙම උපකරණය භාවිතය ඉතා සරලය. මෙය භාවිතා කිරීම සඳහා විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවන අතර අතින් තේ දළු නෙලීමට වඩා පහසු ක්‍රමයකි.

වසර 300 ට වඩා පැරණි ලන්ඩන් තේ වෙන්දේසිය 1998 ජූනි 29 වනදා සිට නවත්වනු ලැබීය. ලන්ඩන් තේ වෙන්දේසිය මෙම තත්ත්වයට පත් වූයේ ක්‍රමයෙන් මෙම වෙන්දේසියෙහි අලෙවිය පිණිස එවන ලද තේ ප්‍රමාණයේ පහත වැටීමයි. තේ නිෂ්පාදනය කරන රටවල් සහ ආනයනය කරන රටවල් අන්තර්ජාලය වැනි නවීන තාක්ෂණය උපයෝගී කරගෙන සිදු කරන සෘජු වෙළඳම් කටයුතු ලන්ඩන් වෙන්දේසිය වෙත යවන තේ ප්‍රමාණය පහත වැටීමට හේතු විය. දනට ලෝකයේ විශාලම තේ වෙන්දේසිය කොළඹ පවත්වනු ලැබේ. කොළඹට ලෝකයේ ප්‍රධානම තේ වෙළඳ මධ්‍යස්ථානය වීමට විශාල හැකියාවක් ඇත. පකිස්ථානය සහ ඩුබායි වැනි රටවල්ද ලන්ඩන් වෙන්දේසිය වැසීමෙන් ඇති වූ රික්තය මඟ හැරීම පිණිස එම රටවල තේ වෙන්දේසි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ඇති හැකියාව විමසා බලමින් සිටී.

ශ්‍රී ලංකාව 1998 වසරේදී ලෝකයේ ප්‍රධානම තේ අපනයනකරු වූ අතර කිලෝග්‍රෑම් දශ ලක්ෂ 271 ක් අපනයනය කළේය. කෙන්යාව කිලෝග්‍රෑම් දශ ලක්ෂ 264 ක් අපනයනය කරමින් දෙවන ස්ථානයට පත්විය.

## රබර්

1996 වසරේ සිට පහත වැටීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ රබර් නිෂ්පාදනය 1998 වසරේදී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 96 ක් දක්වා සියයට 9 කින් තවදුරටත් පහත වැටුණි. හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව පහත වැටීම සහ 1998 වසරේ අවසාන කාර්තුවේ ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් කිරි කැපීමේ දින ගණන අඩු වීම නිෂ්පාදනයේ අඩු වීමට

**3.3 සංඛ්‍යා සටහන**

**රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1996 | 1997(අ) | 1998 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ.දශලක්ෂ | 113 | 106 | 96 |
| 2. බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 162 | 163 | 158 |
| කිරි කැපීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | 122 | 129 | 125 |
| 3. ඵලදාව | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 926 | 822 | 768 |
| 4. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 17 | 12 | 15 |
| 5. නැවත වගා කිරීම් (ඈ) | හෙක්ටයාර | 3,443 | 2,774 | 2,543 |
| 6. අළුතින් වගාකිරීම් (ඈ) | හෙක්ටයාර | 1,297 | 793 | 515 |
| 7. මිල | | | | |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 79.78 | 75.42 | 67.72 |
| කොළඹ (ආර්.ඇස්.ඇස්.1) | කි.ග්‍රෑ./රුපියල් | 67.85 | 56.62 | 49.76 |
| 8. නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ./රුපියල් | 36.70 | 40.37 | 44.41 |
| 9. අපනයන | කි.ග්‍රෑ.දශලක්ෂ | 72 | 62 | 41 |
| 10. දේශීය පරිභෝජනය | කි.ග්‍රෑ.දශලක්ෂ | 40 | 44 | 54 |
| 11. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 5,753 | 4,640 | 2,808 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 104 | 79 | 44 |
| 12. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.9 | 0.7 | 0.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 1993 ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික බෝග සහ පශු සම්පත් සමීක්ෂණය 1993 මත පදනම් වේ.
(ඈ) වගා කළ බිම් ප්‍රමාණය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුවය.
(ඉ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

බලපෑ ප්‍රධාන හේතූන් විය. ආකර්ශණීය නොවූ මිල ගණන් සමහර රබර් වතුවල කිරි කැපීම අතහැර දැමීමට සහ පොහොර යෙදීම අධෛර්යමත් කිරීමටත් හේතු වූ අතර එය ඵලදා මට්ටම තවදුරටත් පහත හෙළීමටද හේතු විය.


1998 වසරේ ජාත්‍යන්තර වෙළෙඳපොළේ රබර් මිල පහත වැටීම දේශීය වෙළෙඳපොළ තුළද ඒ අයුරින්ම පිළිබිඹු විය. කොළඹ වෙන්දේසියේ ආර්.එස්.එස්. වර්ගයේ රබර් සඳහා පැවති වාර්ෂික සාමාන්‍ය මිල රුපියල් 49.76 දක්වා සියයට 12 කින් ශීඝ්‍ර ලෙස අඩු විය. අනෙකුත් වර්ගවල ෂීට් රබර් මිල ගණන්ද පිළිවෙලින් සියයට 15-17 දක්වා ප්‍රමාණ වලින් අඩු විය. 1997 වසර සමඟ සසඳනවිට අනෙකුත් සියළුම වර්ගවල රබර් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) සියයට 10 කින් පහත වැටී රුපියල් 67.72 ක් විය. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු අනුව සාමාන්‍ය රබර් නිෂ්පාදන පිරිවැය (විශාල රබර් වතු සහ කුඩා රබර් වගාවන්) රුපියල් 44.41 ක් විය. කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ ලාභය පහත වැටීමටද එය හේතු විය.

ජාත්‍යන්තර වෙළෙඳපොළේ ස්වාභාවික රබර් මිල ගණන් පහත වැටීමට කරුණු කීපයක් බලපෑවේය. ඇමෙරිකා එක්සත් ජනපදය තමා සතුව තිබූ මහා පරිමාණ රබර් තොග වෙළෙඳපොළට මුදා හැරීම සහ ලෝක ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් සියයට 72 ක් නිපදවන ප්‍රධාන රබර් නිෂ්පාදන රටවල් වන තායිලන්තය, ඉන්දුනීසියාව සහ මැලේසියාව වැනි රටවල 1997 දී විශාල වශයෙන් සිදු වූ මුදලේ අගය අඩුවීම නිසාද රබර් මිල පහත වැටීම වේගවත් විය.1998 වසරේ මුල් භාගයේදී තායිලන්ත රජය විසින් සිය ස්වභාවික රබර් තොග වෙළෙඳපළට නිකුත් කිරීම නිසාද මිල ගණන් පහත වැටීම තවදුරටත් තීව්‍ර විය. බනිජ තෙල්වල මිල ගණන් ශීඝ්‍ර ලෙස පහත වැටීම හේතුවෙන් ස්වභාවික රබර් සඳහා ආසන්නම ආදේශකය වන කෘත්‍රිම රබර් මිල පහත වැටීමද ස්වභාවික රබර් මිල අඩු වීමට හේතුවක් විය. නැගෙනහිර ආසියාතික රටවල සිදු වූ ආර්ථික පසුබෑම හේතුවෙන් වාහන සඳහා එම රටවල වූ ඉල්ලුම විශාල ලෙස අඩු විය. ස්වාභාවික රබර් සඳහා වන ඉල්ලුම, ප්‍රධාන වශයෙන් වාහන සඳහා පවතින ඉල්ලුමට අනුව තීරණය වන ව්‍යුත්පන්න ඉල්ලුමකි. එමගින්ද නැගෙනහිර ආසියාතික රටවල ආර්ථික අර්බුදය විශාල ලෙසින් රබර් ඉල්ලුමට අහිතකර ලෙස බලපෑවේය. වර්තමානයේ පවතින දුර්වල ඉල්ලුම කෙටිකාලීන වශයෙන් මිල මට්ටම් තවදුරටත් පහත වැටීමට හේතු විය හැකිය.

**3.2 රූප සටහන**

**මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක - රබර්**

**(1990 - 100)**




ස්වභාවික රබර් නිෂ්පාදනය හා පරිභෝජනය කරන රටවල සාමාජිකත්වයෙන් සමන්විත වූ ජාත්‍යන්තර ස්වභාවික රබර් සංවිධානය (INRO) මෙවන් අවස්ථාවලදී මිල ගණන් ස්ථායීකරණය සඳහා වෙළෙඳපළට අවතීර්ණ වේ. එසේ වුවද 1997/98 වර්ෂයේ දී එවැනි අවතීර්ණ වීමක් සිදු

නොවූයේ වෙළෙඳපළ දෛනික මිල දර්ශකය එවැනි මැදිහත් වීමක් සඳහා අවශ්‍ය අදාල අවම මිල මට්ටමට වඩා පහල නොවැටීම නිසාය. එම දර්ශකය පිළියෙල කිරීමේදී පදනම් කර ගන්නා සාමාජික රටවල මුදලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් දෛනික මිල දර්ශකය විකෘති වීම තුලින් මතුවී ඇති ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සෙවීමට ජාත්‍යන්තර ස්වාභාවික රබර් සංවිධානය උත්සාහ ගනිමින් සිටී. සමස්ථ වශයෙන් ගත් කල වර්තමානයේ පවත්නා තත්ත්වය යටතේ රබර් මිල ස්ථායීකරණය කිරීමට "ස්වාභාවික රබර් ගිවිසුම" එනම් ලෝකයේ දනට ක්‍රියාත්මක වන එකම සම්ප්‍රදායික භාණ්ඩ මිල ස්ථායීකරණ ගිවිසුම අපොහොසත් වී ඇත. ජාත්‍යන්තර ස්වභාවික රබර් සංවිධානයේ අනාගතයද අවිනිශ්චිත තත්ත්වයක පවතී. ප්‍රධාන රබර් නිෂ්පාදන රටවල් වන මැලේසියාව 1999 ඔක්තෝබර් 15 වැනි දින සිට මෙම සංවිධානයෙන් ඉවත් වීමට අදහස් කරන බව දනටමත් දන්වා තිබීමත්, තායිලන්තය ඉන් ඉවත් වීමට සළකා බලමින් සිටීමත් එයට හේතු වී ඇත.

රබර් මිල පහත වැටීමේ බලපෑම මුලින්ම දනෙන්නේ ආර්.එස්.එස්. රබර් බහුල වශයෙන් නිෂ්පාදනය කරන කුඩා රබර් වතු හිමියන්ගේ අංශයටයි. රබර් මිල මෙසේ පහත වැටීම නිසා සමහර නිෂ්පාදකයින්, විශේෂයෙන් ෂීට් රබර් නිෂ්පාදකයින් ෂීට් රබර් නිෂ්පාදනයේ සිට කේන්ද්‍රාපසාරී රබර් කිරි නිෂ්පාදනය සඳහා රබර් කිරි විකිණීමටත්, ක්‍රේප් රබර් නිෂ්පාදනයටත් මාරු වී ඇත. ඒ හේතුවෙන් 1998 වසරේ ෂීට් රබර් නිෂ්පාදනය 1997 වසරට සාපේක්ෂව සියයට 21 කින් පහත වැටී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 36.5 ක් විය. මුළු රබර් නිෂ්පාදනය සඳහා වූ ෂීට් රබර් නිෂ්පාදනයේ දායකත්වය 1997 වසරේ සියයට 44 ක් වූ අතර, 1998 දී එය සියයට 35 දක්වා පහත වැටුණි. නමුත් ක්‍රේප් රබර් සඳහා පැවති යහපත් මිල ගණන් හේතුවෙන් 1998 වසරේ මුල් කාලයේ මිල ගණන් පහත වැටීමේ උපනතීන් එක්තරා දුරකට පාලනය විය. ලෝක රබර් වෙළෙඳපළේ ක්‍රේප් රබර් සඳහා සැහෙන දායකත්වයක් ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට හිමි වී ඇත. මෙම ක්‍රේප් රබර් වෙළෙඳපළ තවදුරටත් පවත්වාගෙන යනු ලබන්නේ ඉදිරි ගිවිසුම් (Forward contracts) මගිනි. මෙම කාලයේදී මුළු රබර් නිෂ්පාදනය තුල ක්‍රේප් රබර් නිෂ්පාදනයේ දායකත්වය සියයට 39 සිට සියයට 47 දක්වා වැඩි විය.

රබර් මිල ගණන් ක්‍රමයෙන් පහත වැටීම වැළැක්වීමේ අරමුණ ඇතිව, කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 5.40 ක්වූ රබර් සෙස් බද්ද 1998 මැයි මාසයේදී රජය විසින් ඉවත් කරන ලදී. නිෂ්පාදකයින්ට ලැබුණ මිල ගණන් කෙරේ පැහැදිලි හිතකර බලපෑමක් එමගින් ඇති විය.

කර්මාන්ත අංශයේ අන්තර් යෙදවුමක් ලෙස රබර් භාවිතය තවදුරටත් වැඩි විය. එය 1997 වසරේ භාවිතා කල කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 44 ට සාපේක්ෂව 1998 වසරේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 54 දක්වා වූ සියයට 23 ක වර්ධනයකි. ඒ අනුව, රබර් නිමවුමෙන් අඩකටත් වඩා (සියයට 56) ක් කාර්මික අංශය විසින් දේශීය වශයෙන් භාවිතයට ගෙන ඇත. 1998 වසරේ අයවැය ලේඛනය මගින් රබර් නිෂ්පාදන කර්මාන්ත අංශයට ලබා දුන් සහනයන්ද රබර් සඳහා වූ දේශීය ඉල්ලුම වැඩි වීමට හේතු විය.

මිල ගණන් පහත වැටීම සහ අරමුදල් හිඟකම අළුතින් රබර් වගා කිරීම සහ නැවත වගා කිරීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. මෙම අඩු වීම 1998 වසරේ අනු පිළිවෙලින් සියයට 35 ක් සහ සියයට 1 ක්ව හෙක්ටයාර 515 ක් සහ හෙක්ටයාර 1,160 ක් විය. මෙවැනි අවස්ථාවල රබර් අළුතින් වගා කිරීම හා නැවත වගා කිරීම සඳහා රබර් සෙස් බද්ද මගින් එක්රැස් කළ අරමුදලින් මූල්‍ය ආධාර ලබා දේ. රබර් නැවත වගා සහනාධාරය සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන අතර එය වගාකරුවන් දිරිමත් කිරීමේ සාධකයක් ලෙසද ක්‍රියාත්මක විය. බොහෝදුරට කුඩා රබර් වතු හිමියන් රබර් නැවත වගා කිරීම හෝ අළුතින් වගා කිරීම සඳහා මෙම සහනාධාරය ලබා ගැනීමට පෙළඹේ. ඒ නිසාම මෙම සහනාධාර ක්‍රමය තවදුරටත් පවත්වා ගැනීම අතිශයින්ම වැදගත් වනු ඇත. නැතහොත් රබර් කර්මාන්තයේ දීර්ඝකාලීන පැවැත්ම තහවුරු කර ගැනීම උදෙසා සෙස් බද්ද මගින් ඉටු කළ කාර්ය භාරය ඉටු කළහැකි වෙනත් සහනාධාර ක්‍රමයක් පවත්වා ගැනීම වැදගත් වේ. අන්නාසි සහ වැල්දෙඩම් වැනි කෙටිකාලීන බෝග අතුරු බෝග ලෙස නව වගා රබර් ඉඩම්වල වගා කිරීමෙන් රබර් කිරි කැපීම ආරම්භ කිරීම දක්වා වූ මේරීමේ කාලය තුල අමතර ආදායමක් ලබා ගැනීමටද පුළුවන.

අඩු ඵලද මට්ටම ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය මුහුණපා සිටින ප්‍රධානතම ගැටලු වලින් එකකි. ශ්‍රී ලංකාවේ වර්තමාන රබර් ඵලද මට්ටම ඉන්දියාවේ සහ ඉන්දුනීසියාවේ ඵලද මට්ටම්වලට වඩා පහල මට්ටමක පවතී. නිසි කළමනාකාරිත්වය සහ වැහි ආවරණ වැඩි වශයෙන් භාවිතා කිරීම වැනි හේතු නිසා ඉන්දියාවේ සාමාන්‍ය ඵලද මට්ටම ශ්‍රී ලංකාවේ ඵලද මට්ටමට වඩා සියයට 50 කින් පමණ ඉහල මට්ටමක පවතී. කුඩා රබර් වතු හිමියන් පොහොර භාවිතය අඩු කිරීමද ඵලද මට්ටම අඩු වීම හා බැඳී පවතී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑතකදී රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල කුඩා රබර් වතු හිමියන් පිළිබඳව පවත්වන ලද නියැදි සමීක්ෂණයකින් අනාවරණය වූයේ නොකඩවා පොහොර භාවිතා කිරීම තුලින් මෑතකදී සිදු වූ මිල අඩු වීම් තත්වය යටතේ වුවද වගා කටයුතු කරගෙන යාමට හැකියාවක් ලැබී ඇති බවය.

පළපුරුදු කිරි කපන්නන්ගේ හිඟයක් පවතින බවද එම සමීක්ෂණයෙන් අනාවරණය විය. සමීක්ෂණයෙන් හෙළි වූ තවත් කරුණක් වූයේ දනට සිටින කිරි කපන්නන්ගෙන් බහුතරය මහළු අය වීමයි. සාපේක්ෂ වශයෙන් මෙම රැකියාවෙන් ලැබෙන අඩු වැටුප හා අඩු සමාජ පිළිගැනීම ද හේතුවෙන් තරුණ පරපුර කිරි කපන්නන් වශයෙන් රැකියාව කිරීමට අකමැත්තක් දක්වයි. විශේෂයෙන් රැකියාවක් හැටියට රබර් කිරි කැපීම හා සසඳනවිට ඇඟළුම් කම්හල්වල රැකියාව උසස් රැකියාවක් හැටියට සැළකීමට පෙළඹීම කාන්තාවන් රබර් කිරි කැපීමේ නිරත වීම අඩු වීමට හේතු විය. කෙසේ වෙතත් මෙම පළපුරුදු කිරි කපන්නන්ගේ

හිඟය මඟ හැරවීමේ අරමුණෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ වෘත්තීය පුහුණු අංශයේ සහාය ඇතිව 1998 වසරේදී කිරි කපන්නන් 180 දෙනෙකු පමණ පුහුණු කිරීමට කටයුතු කරන ලදි.

## පොල්

1998 වර්ෂයේ මුළු පොල් නිෂ්පාදනය 1997 මට්ටම සමඟ සසඳ බලන කල සුළු අඩු වීමක් පෙන්වීය. ඉකුත් වර්ෂයේ දී පොල් ත්‍රිකෝණය තුළ සිදු වූ වියළි කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම මෙම අඩුවීමට හේතු විය. 1998 ඇස්තමේන්තු ගත පොල් නිෂ්පාදනය සියයට 3 කින්

**3.4 සංඛ්‍යා සටහන**

**පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1996 | 1997 (අ) | 1998 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ඇ) | ගෙඩි දශලක්ෂ | 2,546 | 2,631 | 2,547 |
| කපාපු පොල් | ගෙඩි දශලක්ෂ (ඈ) | 425 | 524 | 362 |
| පොල්තෙල් | ගෙඩි දශලක්ෂ (ඈ) | 328 | 289 | 334 |
| කොප්පරා(ඉ) | ගෙඩි දශලක්ෂ (ඈ) | 39 | 42 | 52 |
| පොල් ගෙඩි අපනයනය | ගෙඩි දශලක්ෂ | 17 | 18 | 18 |
| දේශීය පොල් ගෙඩි පරිභෝජනය(ඊ) | ගෙඩි දශලක්ෂ | 1,720 | 1,744 | 1,762 |
| 2. මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 417 | 417 | 439 |
| 3. නැවත වගාව/යටි වගාව (උ) | හෙක්ටයාර | 578 | 1,221 | 595 |
| 4. නව වගාව (උ) | හෙක්ටයාර | 841 | 931 | 656 |
| 5. පොහොර භාවිතය | මෙ.ටො.දහස් | 39 | 35 | 36 |
| 6. නිෂ්පාදන පිරිවැය | ගෙඩිය/රුපියල් | 2.18 | 2.26 | 2.40 |
| 7. පොල් ගෙඩියක සිල්ලර මිල | ගෙඩිය/රුපියල් | 9.37 | 10.55 | 11.17 |
| 8. සාමාන්‍ය අපනයන මිල නැ.වි.ස.(ඌ) | ගෙඩිය/රුපියල් | 9.42 | 9.63 | 9.73 |
| 9. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 6,091 | 6,939 | 6,110 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 110 | 118 | 94 |
| මද ආශ්‍රිත නිෂ්පාදන (ඌ) | රුපියල් දශලක්ෂ | 4,469 | 4,864 | 3,632 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 81 | 82 | 56 |
| අනෙකුත් නිෂ්පාදන | රුපියල් දශලක්ෂ | 1,622 | 2,075 | 2,478 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 29 | 35 | 38 |
| 10. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (එ) | | 2.0 | 2.3 | 2.6 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)
(ඈ) 1998 සඳහා ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදගත් අනුපාතිකයන්
කපාපු පොල් මෙ.ටො.1 - ගෙඩි 8,000
පොල්තෙල් මෙ.ටො.1 - ගෙඩි 8,800 සහ
කොප්පරා මෙ.ටො.1 - ගෙඩි 5,775
පටහන: පොල් සංවර්ධන අධිකාරිය 1996/97 දී කළ අධ්‍යයනයන් පදනම් කරගෙන 1998 අනුපාතිකයන් සංශෝධනය කරන ලදි. 1996/1997 අනුපාතිකයන් 1997 වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.
(ඉ) අපනයන පමණි.
(ඊ) ඒකපුද්ගල වාර්ෂික ගෘහ පරිභෝජනය පොල් ගෙඩි 94.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුලත් නොවේ.
(උ) පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම්
(ඌ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන්: පොල් වගා කිරීමේ මණ්ඩලය.
පොල් සංවර්ධන අධිකාරිය.
ජාතික පොහොර ලේකම් කාර්යාලය.
ශ්‍රී ලංකා මහ බැංකුව.

අඩු විය. දුර්වල ජාත්‍යන්තර වෙළෙඳපොළ තත්වයන් හේතු කොටගෙන කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය සියයට 31 කින් පහත වැටුණි. 1998 වර්ෂයේ ප්‍රථම භාගය ඉකුත් වර්ෂයේ අනුරූප කාලච්ඡේදය සමඟ සසඳා බලන කල සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කළේය. එසේ වුවද, වර්ෂයේ දෙවන භාගය තුළදී පොල් වගා අංශය වර්ධනය වීමේ ලක්ෂණ පෙන්නුම් කළේය. 1998 වර්ෂය තුළදී පොල් තෙල් නිෂ්පාදනයේ ගෙඩි සමානය සියයට 16 කින් වර්ධනය වී ගෙඩි දශ ලක්ෂ 334 ක් විය. පොල්, වැඩි වශයෙන් දේශීය පරිභෝජනය සඳහා යොදා ගැනේ. 1998 වර්ෂයේ මුළු පොල් නිෂ්පාදනයෙන් සියයට 69 ක් දේශීය පරිභෝජනය සඳහා යොදාගෙන ඇතැයි ගණනය කර ඇත. නිවෙස්වල භාවිතයට අමතරව, රසකැවිලි සහ බිස්කට් සෑදීම සඳහා කර්මාන්ත වල අමු ද්‍රව්‍යයක් ලෙසද පොල් භාවිතා කරනු ලැබේ. මෑත වර්ෂවලදී පොල් භාවිතය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.

පොල් සැපයුමෙහි ඌණතාවය නිසා පොල් ගෙඩියක සාමාන්‍ය මිල වර්ෂය පුරාම සාමාන්‍ය වශයෙන් ඉහළ මට්ටමක පැවතුනි. සැපයුමේ වැඩි දියුණුවීම සහ කපාපු පොල් සහ පොල්තෙල් කර්මාන්ත සඳහා ගෙඩි සඳහා වූ තරඟකාරිත්වය අඩුවීම හේතු කොට ගෙන මිල ක්‍රමයෙන් පහත වැටුණි. එසේ වුවද, 1998 වර්ෂයේ හතරවන කාර්තුව තුළදී ඵලදාව අඩු වන කාලය එළඹීමත් සමඟම මිල මට්ටමද ඉහළ නැඟුණි. ඒ අනුව වර්ෂය අවසානයේදී පොල් ගෙඩි 1,000 ක මිල රුපියල් 7,842 ක් දක්වා ඉහළ ගිය අතර, 1997 වර්ෂයේ අවසානයේදී ගෙඩි 1,000 ක මිල වූයේ රුපියල් 6,495 කි.


කපාපු පොල් සඳහා වූ සාමාන්‍ය අපනයන මිලෙහි (නැ.වි.ස.) සියයට 2 ක අඩු වීමක් දක්නට ලැබුණු අතර, ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා වූ සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) සුළු වැඩි වීමක් පෙන්නුම් කරමින් 1997 වර්ෂයේ වූ රුපියල් 9.63 ක සිට 1998 වර්ෂයේදී රුපියල් 9.73 දක්වා වැඩි විය. එසේ වුවද, 1998 වර්ෂයේ අපනයන මිල ගණන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට අනුව සියයට 9 කින් පහත වැටුණි. පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙහි සියයට 25 ක (රුපියල් අගය අනුව) සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබුණි. පොල් නිෂ්පාදනයේ පහත වැටීම සමඟ නැගෙනහිර ආසියානු කලාපයේ මුදල්වල අවප්‍රමාණයද අපනයන ක්‍රියාකාරිත්වය සඳහා දැඩි බලපෑමක් ඇති කළේය. 1998 වර්ෂයේදී කපාපු පොල් සහ කොප්පරා ආදී ප්‍රධාන පොල් නිෂ්පාදනයන්හි අපනයන මිල පහත මට්ටමක පැවතුණි. මේ සඳහා ප්‍රධාන පොල් අපනයන කරන රටවල් වන පිලිපීනය සහ ඉන්දුනීසියාවෙහි මුදල් අවප්‍රමාණය වීම හේතු විය. 1997 දී රුපියල් දශලක්ෂ 2,075 ක් වූ මද නොවන පොල් නිෂ්පාදිතයන්හි අපනයන ඉපයුම් 1998 දී සියයට 19 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 2,478 ක් වුවද, 1997 දී රුපියල් දශලක්ෂ 6,939 ක් වූ මුළු පොල් නිෂ්පාදිතයන්හි අපනයන ඉපැයුම් වටිනාකම 1998 දී රුපියල් දශලක්ෂ 6,110 දක්වා සියයට 12 කින් පහත වැටුණි.

එසේ වුවද, පොල් තෙල් සඳහා වූ ජාත්‍යන්තර මිල වර්ෂය පුරාම යහපත් තත්ත්වයක පැවතුණි. ප්‍රධාන පොල් නිෂ්පාදිත රටවල සැපයුම් ඌණතාවය සහ පොල් තෙල් සඳහා ආදේශකයන් වන පාම් තෙල් සහ පාම් මද තෙල් සැපයුමෙහි පහත වැටීමද මෙයට හේතුවිය. පොල් තෙල් නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවල් වන පිලිපීනය සහ ඉන්දුනීසියාව 1997 වර්ෂයේ දෙවන භාගය තුළදී 'එල් නිනෝ' සංසිද්ධියේ බලපෑමට දැඩි ලෙස ලක් වීම නිසා පොල් තෙල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය කොප්පරා ලබා ගැනීමේ අපහසුතාවයකට මුහුණ දුන්නේය. නිෂ්පාදනයෙහි හිඟයක් අපේක්ෂා කළ හෙයින් ජාත්‍යන්තර පොල්තෙල් මිල 1998 දී ඉහළ නැඟුනි. දේශීය වෙළෙඳපොළෙහිද එම මිල නැඹුරුව බොහෝ දුරට දක්නට ලැබුණි. කෙසේ වුවද, පොල් ඵලදාව අඩු කාලය ඇරඹීමත් සමගම දේශීය වෙළෙඳපොළෙහිද පොල් හිඟයක් ඇතිවිය. මෙම තත්ත්වය යටතේ 1998 වර්ෂයේ අවසන් භාගයේදී කොප්පරා සහ පොල් තෙල් මිල ගණන් වල සීඝ්‍ර වැඩි වීමක් දක්නට ලැබුණි.

**3.3 රූප සටහන**

**මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක - පොල්**

(1990 - 100)




පොල් වගාව යටතේ පවතින මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 439,000 ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇත. 1998 වර්ෂයේ දී ඵල දරන ලද බිම් ප්‍රමාණය 1997 වර්ෂයේදී මෙන්ම හෙක්ටයාර 363,000 ක් පමණ විය. පොල් වගා කිරීමේ මණ්ඩලය එහි ව්‍යාප්ත සේවා මගින් ඵලදායීතාවය වැඩි කිරීමේ වැඩ සටහන තවදුරටත් ක්‍රියාත්මක කළේය. ඒ අතරතුර, පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව පොල් ඉඩම් කැබලි වී යාම පාලනය කිරීම පිළිබඳ නීති හඳුන්වා දීමට මූලික පියවර ගන්නා ලදී. ඊට අදාල නීති කෙටුම්පත, නීති කෙටුම්පත් සකස් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

1998 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ කපාපු පොල් මෝල් හිමියන් ගේ සංගමය එක්ව සීමාසහිත මහවැලි පොල් වැවිලි සමාගම' නමින් හවුල් ව්‍යාපාර සමාගමක් ආරම්භ කරන ලදී. ප්‍රධාන පොල් වගා ප්‍රදේශයන්හි ඉඩම් කැබලි වී යාමෙන් නිෂ්පාදනයට සිදුවන පාඩුව අවම කර ගැනීම සඳහා මහවැලි ප්‍රදේශ වල පොල් වගාව වැඩි දියුණු කිරීමට මෙම සමාගම බලාපොරොත්තු වේ. මෙම සමාගම මගින් විදේශ විශේෂඥ සහාය ලබා ගෙන උසස් තාක්ෂණය (බිංදු ජලවහනය) යොදා ගනිමින් පොල් වගා කිරීම සඳහා 'මහවැලි බී' කලාපය හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා යන වියදම රුපියල් දශ ලක්ෂ 279 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි අදියර තුනම ක්‍රියාත්මක කර අවසන් වනවිට, හෙක්ටයාර 1,500 ක පමණ ඉඩම් ප්‍රමාණයක් පොල් වගාව යටතට පත් වේ යැයි විශ්වාස කෙරේ. මෙම සමාගම අළුතින් වගා කරන පොල් ඉඩම්වල අතුරු වගාවන් ලෙස කෙසෙල්, බඩ ඉරිඟු වැනි අතුරු වගාවන් ප්‍රචලිත කිරීමටද සැලසුම් කර ඇත.

කපාපු පොල් හැරුණුවිට, 1998 වර්ෂයේදී අනිකුත් අපනයන පොල් නිෂ්පාදිත සඳහා 'සෙස්' බදු අනුපාතිකයන් නොවෙනස්ව පැවතුණි. කපාපු පොල් අපනයනය සඳහා වූ සෙස් බදු අනුපාතිකය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.00 සිට රුපියල් 2.00 දක්වා වැඩි කරන ලදී. මෙම වැඩි වීම 1998 මාර්තු 01 දින සිට 2001 මාර්තු 01 දිනෙන් අවසන් වන ලෙස වර්ෂ තුනක කාලයකට බලපැවැත්වේ. කපාපු පොල් සඳහා 'සෙස්' අනුපාතික වැඩි කරන ලද්දේ නව හවුල් ව්‍යාපාර සමාගම සඳහා ප්‍රමාණවත් අරමුදල් එක් රැස්කර ගැනීමටය. 1998 වර්ෂයේ එකතු කරන ලද මුළු සෙස් බදු ප්‍රමාණය ඊට පෙර වර්ෂයට වඩා සියයට 34 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 147 ක් විය. පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොල් ඉඩම් වර්ධනය සඳහා ආධාර වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට මෙම සෙස් මුදල්, යොදා ගන්නා ලදී. ආධාර වැඩ සටහන් අතර නව වගාව (රුපියල් දශ ලක්ෂ 13.5 ක්), නැවත වගාව (රුපියල් දශ ලක්ෂ 10 ක්), ගෙවතු වගාව (රුපියල් දශ ලක්ෂ 15 ක්) සහ 'කප්රුක ආයෝජන' ණය ක්‍රමය (රුපියල් දශ ලක්ෂ 8 ක්) වේ.

මුළු පොල් නිෂ්පාදනයෙන් සියයට 70 කට වඩා වැඩි ප්‍රමාණයක් දේශීය පරිභෝජනයට ගැනීම පොල් නිෂ්පාදිත සඳහා අපනයන වෙළෙඳපොළ පුළුල් කර ගැනීමේදී බාධාවක් වී ඇත. ඊට අමතරව, ගෘහස්ත පරිභෝජනයේදී පොල් භාවිතා කිරීමේ ක්‍රම මගින්ද සැලකිය යුතු ප්‍රමාණයක අපතේ යාමක් සිදු වේ. පොල් මද භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන පිටි කල පොල් කිරි සහ පොල් ක්‍රීම් වැනි ක්ෂණික නිෂ්පාදිත පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට සැපයීමෙන් ඒවායේ පරිභෝජනය දිරිමත් කිරීම මගින් මෙම අපතේ යාම අවම කරගත හැකි වේ. එබැවින්, එවැනි නිෂ්පාදිතයන් කරනු ලබන නිෂ්පාදකයන්ට අනුබලයන් සැපයීම අවශ්‍ය වන අතර, ඒවායේ දේශීය භාවිතයන් ජනප්‍රිය කිරීම තුලින් වෙළෙඳපළ ප්‍රවර්ධනය කර ගැනීමට අනුබල දීමද අවශ්‍ය වේ. පොල් කටු සහ සක්‍රීය කාබන් වැනි පොල් මද නොවන නිෂ්පාදිතවල ප්‍රධාන පෙලේ අපනයනකරුවකු වන ශ්‍රී ලංකාව පොල් කටු ආශ්‍රිතව කරනු ලබන අතුරු නිෂ්පාදනද තවදුරටත් වැඩි දියුණු කර ගැනීමට පියවර ගතයුතුව ඇත. කුඩු කරන ලද පොල් කටු, කර්මාන්තමය අමු ද්‍රව්‍යයක් වශයෙන් යොදා ගතහැකි බව අධ්‍යයනයන්

මගින් අනාවරණය වී ඇත. එනම් සත්ව ආහාර සකස් කිරීමේදී තන්තුමය ආහාරයක් වශයෙන්ද, මදුරු දහර සඳහා මූලික ද්‍රව්‍යයක් වශයෙන්ද මේවා යොදගත හැකි වේ.

## අනෙකුත් අපනයන බෝග

කරාබුනැටි, කරදමුංගු, කුරුඳු, ගම්මිරිස් සහ සාදික්කා වැනි කුළු බඩුද, කොකෝවා, කෝපි වැනි පානීය බෝගද, කුරුඳු තෙල් සහ පැහිරි තෙල් වැනි වාෂ්පශීලී තෙල් වර්ගද ප්‍රධාන වශයෙන් ඇතුළත් වන බෝග වර්ග රාශියකින් අනෙකුත් අපනයන බෝග අංශය සමන්විත වේ. මෙම අංශය 1998 දී ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 120 දක්වා සියයට 21 කින් අපනයන ඉපයුම් ඉහළ නැංවීම මගින් සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය. ගම්මිරිස්, කොකෝවා, කෝපි, කරදමුංගු සහ කුරුඳු තෙල් නිෂ්පාදනයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

පසුගිය වර්ෂ කීපය තුළ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ගම්මිරිස් නිෂ්පාදනය 1998 දී සියයට 73 කින් ඉහළ ගියේය. ආකර්ශණීය මිල ගණන් යටතේ කළමණාකරණය වැඩි දියුණු වීම සහ අලුතින් එකතු වූ ඵල දරන ඉඩම් ප්‍රමාණය ඉහළ යාම මෙයට හේතු වූ කරුණු වේ. ලෝක වෙළඳපොල ඉල්ලුම වැඩිවීම හා ලෝක සැපයුමේ පැවතුනු ඌණතාවය හේතු කරගෙන ගම්මිරිස් සඳහා වූ ජාත්‍යන්තර මිල අඛණ්ඩව පස් වන වසරටත් ඉහළ ගියේය. අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා බ්‍රසීලය, වියට්නාමය, තායිලන්තය වැනි රටවල ගම්මිරිස් නිෂ්පාදනය පහළ යාමද ලෝක සැපයුමේ ඌණතාවයට හේතු විය. ගම්මිරිස් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 335 දක්වා සියයට 31 කින් ඉහළ ගියේය. සාමාන්‍ය වෙන්දේසි මිල සහ ගොවිපල මිල ගණන්ද, පිළිවෙලින් කිලෝ ග්‍රෑමයකට රුපියල් 287 ක් සහ රුපියල් 262 ක් දක්වා සියයට 28 කින් සහ සියයට 32 කින් ඉහළ ගියේය

'එල්නීනෝ' සංසිද්ධිය හේතු කොටගෙන ලෝකයේ ප්‍රධානම සාදික්කා නිෂ්පාදනය කරන රට වූ ඉන්දුනීසියාවේ නිෂ්පාදනය පහත වැටීම ජාත්‍යන්තර සැපයුම කෙරේ බලපෑවේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සාදික්කාවල සාමාන්‍ය දේශීය ගොවිපල මිල (සාදික්කා හා වසාවාසී) 1998 දී සියයට 80 කින් ඉහළ ගියේය. අනෙකුත් සියලුම අපනයන කෘෂි බෝගවල ජාත්‍යන්තර නිෂ්පාදන මිල ගණන්වල වැඩි දියුණු වීමක් 1998 දී දක්නට ලැබුණි.

මෙම බෝග යටතේ වන භූමි ප්‍රමාණය 1998 දී හෙක්ටයාර 77,782 ක් වශයෙන් සියයට 1 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. හෙක්ටයාර 800 කට ආසන්න ප්‍රමාණයක් වර්ෂය තුළ මෙම බෝග යටතේ අළුතින් වගා කර ඇත. අළුතින් වගා කල භූමියෙන් වැඩිම කොටසක් (සියයට 82) නොකඩවා තෙවන වසරටත් ගම්මිරිස් වගාව යටතේ විය. අපනයන කෘෂිකර්ම බෝග සහන ක්‍රමය යටතේ 1997 කරනු ලැබූ රුපියල් දශ ලක්ෂ 27 ක් වූ ගෙවීම හා සසඳනවිට එය 1998 දී රුපියල් දශ ලක්ෂ 32 ක් විය. පෙර වර්ෂ තුනේදී මෙන්ම මෙම සහන වැඩසටහනේ ප්‍රධාන කොටස (සියයට 70) ගම්මිරිස් සහ කුරුඳු සඳහා විය.

රුපියල් දශ ලක්ෂ 150 ක විශේෂ ප්‍රතිපාදන සහ රුපියල් දශ ලක්ෂ 54 ක සාමාන්‍ය ප්‍රතිපාදන වශයෙන් මෙම අංශය සංවර්ධනය සඳහා 1998 අයවැය මගින් වෙන් කල මුදල රුපියල් දශ ලක්ෂ 204 කි. මෙම විශේෂ අරමුදල් යටතේ මූලික වශයෙන් මහනුවර, මාතලේ, කෑගල්ල, බදුල්ල යන දිස්ත්‍රික්කවල අපනයන කෘෂිකර්ම බෝග සංවර්ධනය අරමුණු කෙරේ. ඒ අනුව මෙම බෝග සංවර්ධනය සඳහා නව ව්‍යාපෘති කීපයක් ආරම්භ කර ඇත. ගම්මිරිස්, කෝපි, කොකෝවා, කරදමුංගු, පැහිරි සහ කුරුඳු නැවත වගාව සහ නව වගාව සඳහා පවතින සහනාධාර අනුපාතිකයන් වැඩි කර ඇත. නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ අස්වනු නෙලීමෙන් පසු වන බෝග හානිය අඩු කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ විශේෂ උපදේශක සේවා ඒකකයක් පිහිටුවා ඇත. මෙම වැඩසටහන යටතේ අපනයන කෘෂිකර්ම බෝග වැඩි දියුණු කිරීම සඳහා නව යන්ත්‍ර උපකරණ, සැකසුම් උපකරණ සහ කාර්මික සහයෝගීතාව ද ලබා දී ඇත. වැවිලි අංශය තුළ මෙම බෝග ජනප්‍රිය කිරීමේ අදහසින් වැවිලි කෘෂිකර්මයට සම්බන්ධ කාර්මික දැනුම සහ බෝග විවිධාංගීකරණයට අවශ්‍ය ව්‍යාප්ති සේවා සැපයුම සඳහා වැවිලි උපදේශක ඒකකයක් පිහිටුවා ඇත.

1997 දී නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු එහි දෙවන අදියර සඳහා ණය මුදලක් ලබා ගැනීමට රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා පවත්වන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වාණිජමය පදනමක් යටතේ ක්‍රියාත්මක විය හැකි නිත්‍ය බෝග අංශයක් ඇති කිරීම වේ.

දෙවන නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතියෙහි කටයුතු 1998 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරනු ලැබීය. ආසියානු සංවර්ධන බැංකුව විසින් ඩොලර් දශ ලක්ෂ 20 ක් සහනදායී ණයක් වශයෙන් ප්‍රදානය කල අතර, ඩොලර් දශ ලක්ෂ 15 ක් පමණ වන ඉතිරි ප්‍රමාණය සහභාගිත්ව ණය නියෝජිත ආයතන මගින් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති කාලය අවුරුදු 6 කි. පළමු නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය

**3.5 සංඛ්‍යා සටහන**
**අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනයන්**

මෙට්‍රික් ටොන්

| බෝගය | 1996(අ) | 1997(අ) | 1998(ආ) |
|---|---|---|---|
| කෝපි | 2,158 | 2,165 | 2,343 |
| කොකෝවා | 1,628 | 1,709 | 1,904 |
| කුරුඳු පොතු | 10,891 | 11,453 | 11,206 |
| කුරුඳු තෙල් (කොළ) | 110 | 100 | 150 |
| ගම්මිරිස් | 3,988 | 3,912 | 6,776 |
| කරාබු නැටි | 1,437 | 2,333 | 2,022 |
| කරදමුංගු | 75 | 75 | 90 |
| සාදික්කා සහ වසාවාසි | 1,198 | 1,108 | 1,382 |
| පැහිරි | 190 | 210 | 190 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

දිස්ත්‍රික්ක 8 ක්‍රියාත්මක වූ අතර ව්‍යාපෘතියේ දෙවන අදියර දිස්ත්‍රික්ක 17 ක් ආවරණය වන පරිදි ව්‍යාප්ත කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ මාස 4 තුළ රුපියල් දශ ලක්ෂ 84 ක් සඳහා ණය අයදුම්පත් 107 ක් අනුමත කර ඇති අතර එම මුදලින් රුපියල් දශ ලක්ෂ 10 ක මුදලක් මුදා හැර ඇත.

## 3.4 දේශීය කෘෂිකර්මය

### වී

1997 දී සියයට 9 කින් ඉහළ ගිය වී නිෂ්පාදනය 1998 දී සියයට 20 කින් ඉහළ ගියේය. 1998 දී මුළු වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.7 ක් (බුසල් දශ ලක්ෂ 129) විය. මෙය මෙතෙක් වාර්තා වූ දෙවන ඉහළම නිෂ්පාදන මට්ටම වන අතර, 1995 වාර්තා වූ උපරිම මට්ටමට වඩා අඩුවන්නේ සියයට 4 කින් පමණය. මහ සහ යල කන්න දෙක තුළම වී නිෂ්පාදනය වැඩි විය. වී වගා කළ භූමි ප්‍රමාණය සියයට 16 කින් වැඩි වීම මෙන්ම 1998 යල කන්නයේ සාමාන්‍ය අස්වැන්න සැලකිය යුතු ලෙස වර්ධනය වීම නිෂ්පාදනයේ මෙම වැඩි වීමට දායක විය.

1997/98 මහ කන්නයේ වී නිමවුම සියයට 22 කින් වැඩි වී මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.78 (බුසල් දශ ලක්ෂ 85) ක් විය. මෙය 1982/83 මහ කන්නය තුළ වාර්තා වූ උපරිම නිෂ්පාදන මට්ටමට බොහෝදුරට සමානය. මහ අස්වැන්න වැඩි වීමට හේතු වූයේ ඊසානදිග මෝසම් සුළං සමයේ ලද සාමාන්‍ය වර්ෂාපතනය සමග විශේෂයෙන් අනුරාධපුර, මඩකලපුව, කුරුණෑගල වැනි වියලි කලාපීය දිස්ත්‍රික්කවල වගා කල බිම් ප්‍රමාණය ඉහළ යාමයි. මෙම දිස්ත්‍රික්ක තුනෙහි වී නිෂ්පාදනය මුළු නිෂ්පාදන වර්ධනයෙන් සියයට 90 කට වඩා ප්‍රමාණයකට දායක විය. නිෂ්පාදනය හතර ගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි වී මෙට්‍රික් ටොන් 230,000 ක සැලකිය යුතු වැඩි වීමක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. අනුරාධපුර, අම්පාර, කුරුණෑගල සහ පොළොන්නරුව වැනි ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්ක මුළු නිෂ්පාදනයෙන් සියයට 48 කට දායක විය. 1997 දී යම් ප්‍රමාණයක යථා තත්ත්වයකට පත් වූ යල නිෂ්පාදනය 1998 දී යල කන්නයේ දී සියයට 16 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 911,000 ක් (බුසල් දශ ලක්ෂ 44) විය. 1998 යල කන්නයේදී පහතරට වියලි කලාපයේ දිස්ත්‍රික්කවල නිෂ්පාදනය විශාල වශයෙන් වැඩි වීම මගින් තෙත් කලාපයේ ප්‍රදේශවල වී නිෂ්පාදනයහි වූ පහත වැටීමේ බලපෑම සමහන් විය.

වාර්ෂික සාමාන්‍ය වී අස්වැන්න 1998 දී හෙක්ට-යාරයකට කිලෝ ග්‍රෑම් 3,636 දක්වා සියයට 1 කින් ඉහළ ගියේය. මහ කන්නයේ සාමාන්‍ය අස්වැන්න පහත වැටී තිබියදීත් වාර්තා වූ මෙම වර්ධනයට හේතු වූයේ යල කන්නයේ සාමාන්‍ය අස්වැන්න විශාල වශයෙන් වැඩි වීමය.

**3.6 සංඛ්‍යා සටහන**

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**


| අයිතමය | ඒකකය | 1997 (අ) | | | 1998(ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 473 | 257 | 730 | 574 | 274 | 848 |
| අස්වැන්න කපාගන්නා ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 443 | 247 | 690 | 563 | 266 | 829 |
| අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 397 | 222 | 619 | 501 | 239 | 740 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 1,457 | 782 | 2,239 | 1,781 | 910 | 2,692 |
| | බුසල් දහස් | 69,835 | 37,496 | 107,331 | 85,345 | 43,607 | 128,952 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 3,670 | 3,529 | 3,618 | 3,555 | 3,802 | 3,634 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශලක්ෂ | 275 | 108 | 383 | 178 | 99 | 277 |
| සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම් | මෙ.ටො.දහස් | - | - | - | - | - | - |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 306 | - | - | 168 |
| (වී සමානය) | (මෙ.ටො.දහස්) | (-) | (-) | (438) | - | - | (240) |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොටගත් ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම දෙපාර්මේන්තුව
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය
වී අලෙවි මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1997/98 මහ කන්නය තුළ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,555 දක්වා සියයට 3 කින් පහත වැටුණි. මෙය කන්නය තුළ ලැබුණු යහපත් වර්ෂාපතන තත්ත්වය හේතුවෙන් ආන්තික බිම්ද වී වගාව සඳහා යොදා ගැනීම විශාල වශයෙන් වැඩි වීමේ ප්‍රතිඵලයකි. මෙම තත්වයට වෙනස්ව 1998 යල කන්නය තුළ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,806 (අක්කරයකට බුසල් 75) ක් ලෙස මෙතෙක් ලැබූ හොඳම සාමාන්‍ය අස්වැන්න වශයෙන් සියයට 8 කින් ඉහළ ගියේය. යල කන්නය තුළදී සාමාන්‍ය අස්වැන්න වර්ෂාපෝෂිත, සුළු වාරිමාර්ග සහ මහා වාරිමාර්ග ක්‍රම යන තුන් ආකාර වාරිමාර්ග ක්‍රම යටතේම සැලකිය යුතු ලෙස වැඩි දියුණු විය. වර්ෂාපෝෂිත වගා ප්‍රදේශවල අස්වැන්න 1997 යල කන්නය හා සසඳනවිට සියයට 10 ක වැඩි දියුණු වීමක් පෙන්නුම් කළේය. 1997 දී සියයට 5 ක් වූ බෝග හානිය නිසි වර්ෂාපතනය හේතුවෙන් සියයට 2 දක්වා අඩු විය. උඩවලවේ ප්‍රදේශය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,787 ක් වශයෙන් උපරිම සාමාන්‍ය අස්වැන්නක් යල කන්නයේදී වාර්තා කළේය. නොකඩවා දෙවන වසරටත් මහවැලි ' එච් ' කලාපයේ මහ අස්වැන්න ඉකුත් මහ කන්නයට වඩා සියයට 7 කින් වැඩි වී ඉහළම සාමාන්‍ය අස්වැන්න වශයෙන් වාර්තා විය.

**3.4 රූප සටහන**
**වී නිෂ්පාදනය**




කෘෂිකර්ම රක්‍ෂණ මණ්ඩලය විසින් වගා හානිවලට එරෙහිව රක්‍ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය 1998 වර්ෂයේදී හෙක්ටයාර 14,000 ක් වූ අතර එකතු කල වාරික ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 9.25 ක් විය. වර්ෂය තුල කරන ලද හානි රක්‍ෂණ ගෙවීම් රුපියල් දශ ලක්‍ෂ 1.5 ක් විය. 1973 අංක 27 දරන කෘෂිකාර්මික රක්‍ෂණ පනතට අනුව සියළුම වී වගා කරන ඉඩම් වගා හානියට එරෙහිව රක්‍ෂණය කිරීම අත්‍යාවශ්‍ය වේ. කෙසේ වෙතත් රක්‍ෂණය කරන ලද බිම් ප්‍රමාණය වපුරන ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට 2 කට වඩා අඩුය. වගා රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා අඩු සහභාගිත්වයට හේතු වූයේ කෘෂිකාර්මික රක්‍ෂණ මණ්ඩලයට අදාල නීතිය ක්‍රියාත්මක කිරීමේදී පවතින ප්‍රායෝගික ගැටළු සහ අවදානම අඩු ප්‍රදේශවල ගොවීන් ස්වේච්ඡාවෙන් යෝජනා ක්‍රමයට සහභාගී වීමට ඇති අකමැත්තයි.

වී වගා අංශය සඳහා මහ සහ යල කන්න දෙක තුළදී නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 4 කින් ඉහළ ගියේය. පෙර වර්ෂයේ නිකුත් කල මෙට්‍රික් ටොන් 242,000 හා සසඳන කල 1998 වර්ෂයේ නිකුත් කල මුළු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 251,000 කි. මහ කන්නය තුළ පොහොර නිකුත් කිරීම් සියයට 5 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 162,000 ක් වූ අතර, යල කන්නය තුළ නිකුත් කිරීම් සියයට 2 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 89,500 ක් විය.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 1997/98 මහ කන්නය තුළදී රුපියල් දශ ලක්‍ෂ 178 ක මුදලක් වී වගා අංශය සඳහා ප්‍රදානය කර ඇත. මෙය පෙර වසරේ අනුරූප කාලච්ඡේදයේ ප්‍රදානය කල ණයවලට වඩා සියයට 35 කින් අඩුය. 1997 යල කන්නයේ ප්‍රදානය කල ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 108 වූ අතර එය 1998 යල කන්නයේදී රුපියල් දශ ලක්‍ෂ 99 දක්වා පහත වැටුණි.

නිෂ්පාදනයෙහි වැඩි වීම නිසා සාමාන්‍ය වී නිෂ්පාදන මිල පසුගිය වර්ෂය හා සසඳනවිට බුසලකට රුපියල් 215 දක්වා (කිලෝ ග්‍රෑමයකට රුපියල් 10.32) සියයට 7 කින් පහත වැටුණි. කෙසේ වෙතත් 1993 සිට සංශෝධනයට ලක්නොවූ සහතික මිල වන බුසලකට රුපියල් 155 ට (කිලෝ ග්‍රෑමයකට රුපියල් 7.42 ක් වූ) වඩා ඉහළ මට්ටමක පැවතුනේය. වී අලෙවි මණ්ඩලය 1996 සිට වී මිලදී ගැනීම සඳහා ක්‍රියාකාරීව සහභාගී වූයේ නැත. එහෙත් සමූපකාර තොග වෙළඳ සංස්ථාව සහ ගොවි සංවිධාන විසින් කිලෝවකට රුපියල් 9-12.40 මිලක් යටතේ වී මිලදී ගැනීම මගින් අස්වනු නෙලා ගනු ලබන කාලයේදී මිල ස්ථායී-කරණයට ඉවහල් විය.

වී වගා අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් නම් ඉහළ යමින් පවතින වී නිෂ්පාදන පිරිවැය සහ ලාභදායීතාවය අඩු වීමයි. විශේෂයෙන් වේතන, ට්‍රැක්ටර් කුලී සහ කෘෂි රසායන ආදී යෙදවුම් වල ඉහළ පිරිවැය නිසා සාමාන්‍ය වී නිෂ්පාදන පිරිවැය පසුගිය කාලය මුළුල්ලේම ඉහළ ගොස් ඇත. මේ තත්ත්වය යටතේ විශේෂයෙන් තෙත් කලාපයේ සමහර දිස්ත්‍රික්කවල වී වගාව ප්‍රමාණවත් ආදායම් නොලබන කාර්‍යයක් බවට පත් විය. රජය විසින් මෙම ගැටලුව හඳුනාගෙන ඇති අතර, හඳුනාගත් ප්‍රදේශවල පර්යේෂණ පවත්වා වී ගොවීන් වෙනත් බෝග වගාවන්ට පෙළඹවීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 1998 අයවැය මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට විශේෂ ප්‍රතිපාදනයන් වෙන් කර ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය සිය 'යාය' ආදර්ශන විශේෂ වැඩ සටහන් 1998 දී තුන්වැනි වසරටත් ගොවීන් 13,000 ක් අතර ක්‍රියාත්මක කළේය. මෙම වැඩ සටහන මගින් බලාපොරොත්තු වන්නේ වගා කිරීමේ විද්‍යාත්මක ක්‍රම පිළිබඳව ගොවියාගේ දැනුවත්භාවය වැඩි කිරීමයි. ශ්‍රී ලංකාවේ වී ඵලදාව අනිකුත් සියළුම සාර්ක් රටවලටත්, ආසියාවේ අනෙකුත් ප්‍රධාන වී නිෂ්පාදන රටවල් වන තායිලන්තයට, බුරුමයට හා පිලිපීනයට වඩා වැඩිය. එහෙත් චීනය, දකුණු කොරියාව හා ජපානය යන රටවල වී ඵලදාව ශ්‍රී ලංකාවේ මට්ටමට වඩා එක හමාරකටත් වැඩිය. එබැවින් ශ්‍රී ලංකාවේ වී ඵලදාව වැඩිකිරීමේ ශක්‍යතාවයක් ඇතිබව පැහැදිලිය.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන ලද 1996/97 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය කිලෝග්‍රෑම් 106 ක් වේ. අපතේ යාම් හා බිත්තර වී සඳහා අවශ්‍ය වී ප්‍රමාණයට අදාලව ගැලපීම් කළ පසුව පරිභෝජනය සඳහා ලබාගත හැකි ප්‍රමාණය මගින් සියයට 83 ක ස්වයංපෝෂිත මට්ටමක් පිළිබිඹු කරයි. දේශීය සැපයුමෙහි ඌණතාවය ආනයන මගින් පියවා ගන්නා ලදි. 1998 දී සහල් මෙට්‍රික් ටොන් 1,68,000 ක් ආනයනය කරනු ලැබීය. මෙම ආනයන ප්‍රමාණයෙන් සියයට 75 ක් එනම් මෙට්‍රික් ටොන් 1,25,000 ක් ආනයනය කරනු ලැබුයේ දේශීය වෙළෙඳපොලෙහි සහල් මිල අධික ලෙස ඉහළ යාම වැළැක්වීම සඳහා සහල් ආනයන මත වූ තීරුබදු ඉවත් කරනු ලැබූ ජනවාරි මාසය තුලදීය. 1998 අග භාගයේදීද සහල් සඳහා තීරුබදු ඉවත්කරවා ගැනීමට ආනයනකරුවන්ගේ කණ්ඩායම් උත්සාහ දැරුවද රජය ගොවීන්ගේ අවශ්‍යතාවයද සළකා වී මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීමේ අභිලාෂයෙන් ආනයන කරුවන්ගේ ඉල්ලීමට ඉඩ නොදුන්නේය.

## අනෙකුත් ක්ෂේත්‍ර බෝග

අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා අංශය 1998 දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. අර්තාපල්, ළූණු සහ මිරිස් වැනි ඉහළ වටිනාකම් සහිත බෝග වල අස්වැන්න පහත වැටුණු අතර උඳු, මුං, සෝයා බෝංචි වැනි රනිල බෝග නිෂ්පාදනයෙහි ඉහළ යාමක් දක්නට ලැබුණි.

ලැබී ඇති තාවකාලික ඇස්තමේන්තුවලට අනුව උඳු (සියයට 30), මුං (සියයට 14), සෝයා (සියයට 55) සහ කව්පි (සියයට 5) නිෂ්පාදනය ඉහළ ගියේය. අස්වැන්න සියයට 14 ක ප්‍රතිශතයකින් වැඩි දියුණු වීමේ හේතුවෙන් කව්පි නිෂ්පාදනය ඉහළ ගියේය. 1997 හා සසඳනවිට රටකජු හා තල තිමවුම පහත වැටුණි. උඳු, මුං සහ සෝයා බෝංචි නිමවුම ඉහළ යාම සඳහා වගා කල භූමි ප්‍රමාණය මෙන්ම අස්වැන්න වැඩි දියුණු වීමද දයක විය. බඩ ඉරිඟු සහ කුරක්කන් වැනි ධාන්‍ය බෝග නිමවුමද සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. බඩ ඉරිඟු නිෂ්පාදනය සියයට 49 කින් ඉහළ ගිය අතර, සෞඛ්‍ය සම්පන්න ආහාරයක් ලෙස ජනප්‍රිය වෙමින් පවතින කුරක්කන් නිෂ්පාදනය සියයට 35 කින් වැඩි විය.

1996 සිට ආනයන සීමා ඉවත් කිරීම නිසා තියුණු තරඟයකට මුහුණ දුන් මිරිස්, අර්තාපල්, රතු ළූණු සහ ලොකු ළූණු නිෂ්පාදනය 1998 දී තවදුරටත් පහත වැටුණි. අර්තාපල් යටතේ වූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 2,300 දක්වා සියයට 64 කින් පහත වැටුණ අතර, ලොකු ළූණු වගාව යටතේ වූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 1,400 දක්වා සියයට 52 කින් පහත වැටුණි. දැඩි ආරක්ෂිත වෙළෙඳපොළ තත්ත්වයක් යටතේ විශේෂයෙන් අර්තාපල් වගා කල ගොවීන්ට වූ මිල වාසිය, විශාල පාරිභෝගිකයන් සංඛ්‍යාවකට අයත් වන වාසි සළකා ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙන් අර්තාපල් ආනයනය කිරීම නිසා නැති වී ගියේය. පෙර වර්ෂයේ සියයට 35 කින් පහත වැටුණු අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25,900 දක්වා සියයට 61 කින් තව දුරටත් පහත වැටීමක් වාර්තා කළේය.

ලොකු ළූණු නිෂ්පාදනය 1998 දී සියයට 40 කින් පහත වැටුණි. කෙසේ වෙතත් 1997 හා සසඳනවිට, 1998 දී ලොකු ළූණු ආනයනයද මෙට්‍රික් ටොන් 90,700 දක්වා සියයට 24 කින් පහත වැටුණි. මෙයට හේතු වූයේ, සිය නිෂ්පාදනය අධික ලෙස පහත වැටීම නිසා ඉන්දියාව විසින් ලොකු ළූණු අපනයනය තහනම් කිරීමය. මේ හේතුව නිසා 1998 නොවැම්බර් මාසයේදී දේශීය ලොකු ළූණු මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 71.25 දක්වා සියයට 64 කින් වැඩි විය.

අර්තාපල් නිෂ්පාදන අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය සඳහා කරුණු කීපයක් හේතු විය. 1968 සිට 1996 දක්වා පාරිභෝජනය සඳහා අර්තාපල් ආනයන තහනම් කළ තත්ත්වයක් යටතේ දේශීය අර්තාපල් නිෂ්පාදනය දැඩි ලෙස ආරක්ෂාවී පැවැතුණි. මෙම අධික ආරක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් අර්තාපල් වගාව කාලයත් සමග ක්‍රමයෙන් අකාර්යක්ෂම තත්ත්වයට පත් වූයේය. මේ සමහම අස්වනු මට්ටම භාගයකින් පමණ (හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 16 සිට මෙට්‍රික් ටොන් 10 දක්වා) පහත වැටුණි. ආනයනය පාලනය කල අවධියේදී අර්තාපල් වගාව ඉහළ ආදයම් ලබා දෙන බෝගයක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් බදු ගෙන අර්තාපල් වගා කල ගොවීන් (විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ) නිසි කෘෂිකාර්මික පිළිවෙත් කෙරේ යොමු නොවූ අතර, ශෂ්‍ය මාරු ක්‍රමයන්ද නොසලකා හරින ලදී. සමහර ගොවීන් නොකඩවා එකම වගාබිමේ අර්තාපල් වගා කල අතර, එය පාංශු ආශ්‍රිත රෝගයන්ට මෙන්ම පසුකාලීනව අස්වැන්න පහළ යාමටද හේතුවිය. කිලෝවකට රු. 26 ක් වන දේශීය අර්තාපල් නිෂ්පාදන පිරිවැය අනිකුත් රටවල් හා සසඳනවිට බෙහෙවින් ඉහළ මට්ටමක වේ. අඩු අස්වැන්න, මුළු වියදමින් සියයට 50 ක් පමණ වන ඉහළ බීජ අර්තාපල් පිරිවැය සහ ඉහළ වැටුප් අනුපාතිකයන්, ඉහළ නිෂ්පාදන පිරිවැය සඳහා බලපා ඇති ප්‍රධාන කරුණු වේ. ශ්‍රී ලංකාව නෙදර්ලන්තයෙන් හා ඕස්ට්‍රේලියාවෙන් වැඩි වශයෙන් බීජ අර්තාපල් ආනයනය කරයි. බීජ අර්තාපල් විශාල තොග වශයෙන් ආනයනය කළයුතු අතර ආනයනය කරන ලද බීජ අර්තාපල් මිල ඉහළ මට්ටමක වේ. ශ්‍රී ලංකාව මෙන් නොව ඉන්දියාව අඩු පිරිවැයකින් ඉන්දියාවේ උතුරු ප්‍රදේශවල එරටට අවශ්‍ය බීජ අර්තාපල් නිෂ්පාදනය කරයි. ඉන්දියාවේ ශ්‍රම වියදම්ද ශ්‍රී ලංකාවේ ශ්‍රම වියදම්වලට වඩා පහළ මට්ටමක පවතී. එයට අමතරව, ඉන්දියාවේ සමහර යෙදවුම් විශාල සහන ක්‍රම යටතේ සැපයේ. කෘෂි යෙදවුම් සඳහා විශාල වශයෙන් සහනාධාර ලබා දී ඇත. එමනිසා සියයට 35 ක තීරු බදු ආරක්ෂණය යටතේ වුවද ඉන්දියාව, පාකිස්ථානය සහ අනිකුත් රටවල් 15 කින් ආනයනය කරනු ලබන මිල අඩු අර්තාපල් සමඟ දේශීය අර්තාපල් නිෂ්පාදකයින්ට තරඟ කිරීමට අපහසුය. ශ්‍රී ලංකාව අර්තාපල් මෙට්‍රික් ටොන් 116,000 ක් 1998 දී ආනයනය කළ අතර, මින් සියයට 86 ක්ම ආනයනය කර ඇත්තේ ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙනි. 1998 දී අර්තාපල් ආනයනයන් සියයට 7 කින් ඉහළ ගියේය. ආනයන සීමා, ආනයන බලපත්‍ර ලබා ගැනීම වැනි තීරු බදු නොවන වෙළෙඳ බාධක මගින් දැඩි ආරක්ෂණයක් ලබා දුන් මිරිස් ඉහළ ආදයම් ලබා දෙන

බෝගයක් විය. කෙසේ වෙතත් ආනයන සීමාවන් ඉවත් කිරීමත් සමඟ ඉහළ නිෂ්පාදන පිරිවැය යටතේ නිපදවූ දේශීය මිරිස් නිෂ්පාදනය තරඟකාරී නොවන තත්ත්වයට පත් විය. මිරිස් වගාව යටතේ වූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 21,600 දක්වා සියයට 10 කින් පහත වැටුණු අතර, නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 15,600 දක්වා සියයට 13 කින් පහත වැටුණි. 1998 දී මිරිස් ආනයනය මෙට්‍රික් ටොන් 19,200 දක්වා සියයට 45 කින් ඉහළ ගියේය.

ඉහළ වටිනාකම් සහිත බෝගයන් වන මිරිස්, අර්තාපල් සහ ළූණු හැරුණුවිට වෙනත් බොහෝ බෝගයන් සඳහා රජයේ අවධානය සහල් නිෂ්පාදනය සඳහා යෙදවූ අවධානයට සාපේක්ෂව අඩුය. මෙහි ප්‍රතිඵලය වූයේ එකී බෝග සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධනය ප්‍රමාණවත් නොවීමය. ගොවීහු බොහෝවිට වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ පාරම්පරික වගා ක්‍රම අනුව බොහෝ අඩු මට්ටමක පොහොර වැනි යෙදවුම් භාවිතා කරමින් රනිල බෝග හා ධාන්‍ය බෝග වගා කරති. දුර්වල කළමණාකරණය මෙම බෝග වල පහළ අස්වනු මට්ටම සඳහා හේතු වී ඇත.

## එළවළු සහ පළතුරු

ලැබී ඇති ප්‍රාථමික ඇස්තමේන්තුවලට අනුව මධ්‍යම පළාතේ වාරි පහසුකම් යටතේ සූක්ෂමව වගා කෙරෙන සෞම්‍ය කලාපීය එළවළු වර්ග වූ කැරට්, ගෝවා, බීට් සහ ලීක්ස් වැනි උඩරට එළවළු වර්ග 1998 දී සියයට 6 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 169,900 ක් විය. නුවරඑළිය සහ වැලිමඩ ප්‍රදේශවල ගොවීන් අර්තාපල් වගාවේ සිට අනෙකුත් එළවළු වගාවන් සඳහා මාරු වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම එළවළු බෝග වගාකළ භූමි ප්‍රමාණය වැඩි වීම මෙයට එක්තරා දුරකට බලපෑවේය. උඩරට එළවළු සැපයුම ඉහළ යාම නිසා බොහෝදුරට වර්ෂය පුරාම මිල ගණන් ස්ථාවරව පැවැතුණි. කෙසේ වෙතත් වයඹ, උතුරුමැද සහ දකුණු පළාත්වල කරවිල, පතෝල, වට්ටක්කා සහ වම්බටු වැනි පහතරට එළවළු වගාව යල කන්නය තුළ පහත වැටුණි. මෙයට හේතු වූයේ ප්‍රමාණවත් වැසි සහ වාරි ජලය ලැබීම නිසා එම ඉඩම් වැඩි වශයෙන් වී වගාව සඳහා යොදා ගැනීමය. වර්ෂය තුල සමස්ත එළවළු නිෂ්පාදනය පෙර වසර හා සසඳනවිට මෙට්‍රික් ටොන් 352,000 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. කෙසේ වෙතත් එළවළු අපනයනය මෙට්‍රික් ටොන් 7,700 දක්වා සියයට 12 කින් ඉහළ ගියේය.

1997 වසර හා සසඳනවිට අඹ නිෂ්පාදනයෙහි සියයට 2 ක ඉහළ යාමක් දක්නට ලැබේ. ඇඹිලිපිටිය හා උඩවලවේ ප්‍රදේශවල මහා පරිමාණ කෙසෙල් නිෂ්පාදනය නිසා දේශීය සැපයුම ඉහළ ගිය අතර කෙසෙල් සඳහා වූ පරිභෝගික මිලෙහි සුළු අඩුවීමක් දක්නට ලැබුණි. පැපොල් සහ අන්නාසි නිෂ්පාදනය පිළිවෙළින් සියයට 13 ක් හා සියයට 18 ක් අඩුවී යැයි ඇස්තමේන්තු කර ඇත. සකස් නොකල පළතුරු අපනයනය මෙට්‍රික් ටොන් 2,670 ක් දක්වා සියයට 10 කින් අඩුවිය.

ශ්‍රී ලංකාවේ පළතුරු නිෂ්පාදනය විශාල වශයෙන් සිදු වන්නේ වාණිජමය නොවන ආකාරයකටය. ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල අන්නාසි සහ හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්කවල කෙසෙල් හැරුණුවිට සංවිධානාත්මක ආකාරයට වගා කල පළතුරු වතු නැත. නුවරඑළියේ හරිතාගාර තුළ සූක්ෂම ක්‍රම යටතේ ස්ට්‍රෝබෙරි වගා කරනු ලැබේ. පළතුරු අතුරින් අඹ, කෙසෙල්, අන්නාසි හා පැපොල් වැදගත් ඒවා වේ. පළතුරු වගාව සහ සැකසුම පිළිබඳව කල පර්යේෂණ ඉතාමත් සීමිතය. දේශීය හා අපනයන වෙළෙඳපොළ සඳහා මෙම පළතුරු බෝග අතුරින් සමහරක් වැඩි වශයෙන් වගා කිරීම සහ සකස් කිරීම සඳහා සැලකිය යුතු ඉඩ ප්‍රස්තා ඇත.

## සීනි

1998 වසරේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 61,549 ක් වූ අතර එය පසුගිය වසරේ නිෂ්පාදනය සමඟ සසඳනවිට සියයට 2 ක පමණ සුළු අඩු වීමක් පෙන්නුම් කරයි. අසාර්ථක පෞද්ගලීකරණයට පසුව නැවත රජයට පවරා ගත් හිඟුරාණ සීනි කර්මාන්තශාලාව මේ කාලය තුළදී ක්‍රියාත්මක නොවීම සීනි නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලාවල නිෂ්පාදනය 1998 වර්ෂයේදී පිළිවෙලින් සියයට 5 කින් සහ සියයට 13 කින් ඉහළ ගියේය. පැල්වත්ත සීනි සමාගමේ උක් අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණයේ පහළ වැටීමක් පෙන්නුම් කලද, මෙම කර්මාන්තශාලා දෙකෙහිම සීනි නිෂ්පාදනය වැඩි විය. උක් අස්වැන්න ඉහළ යාම ඊට හේතු විය. පැවැති යහපත් කාලගුණ තත්ත්වය හේතුකොටගෙන පැල්වත්ත සාමාන්‍ය උක් අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 45 දක්වා සියයට 36 කින් ඉහළ ගිය අතර, සෙවනගල සාමාන්‍ය උක් අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 81 දක්වා සියයට 16 කින් වැඩි විය. මෙසේ උක් අස්වැන්නේ වැඩි වීම් වාර්තා වුවත්, පැල්වත්ත සහ සෙවනගල උක් අස්වනු මට්ටම් අතර විශාල වෙනසක් පවතී. මෙයට ප්‍රධාන හේතුව මෙම සමාගම් දෙකේ උක් වගා කටයුතු සඳහා වෙනස් ජල සම්පාදන ක්‍රම යොදා ගැනීමයි. සෙවනගල උක් වගාව ප්‍රධාන වශයෙන් වාරි ජලය පදනම් කරගෙන සිදු කරන අතර පැල්වත්ත සම්පූර්ණයෙන්ම වර්ෂාපෝෂිත වගාවකි. 1998 වර්ෂයේදී පෞද්ගලික ගොවීන්ගේ උක් දඬු මිලදී ගැනීම් ප්‍රමාණයන් මෙම කර්මාන්තශාලා දෙකෙහිම කලින් වසරේ පැවැති මට්ටමේම පැවතිණි.

දේශීය සීනි නිෂ්පාදනය රටේ සම්පූර්ණ සීනි පාරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 10-12 අතර ප්‍රමාණයක් සපුරාලීමට ප්‍රමාණවත්ය. 1997 වසරේ ආනයනය කල විශාල සීනි තොග (මෙට්‍රික් ටොන් 545,000) නිසා 1998 වසරේ සීනි ආනයනය සියයට 19 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 444,300 ක් විය. මේ කාලච්ඡේදය තුළදී ලෝක වෙළෙඳපොළේ සීනි මිල මෙට්‍රික් ටොන් එකක් ඇ.එ.ජ. ඩොලර් 337 සිට 291 දක්වා සියයට 14 කින් පහත වැටුණි. 1998 ජනවාරි මාසයට පෙර, රජය ආනයනික සීනි මිල මෙට්‍රික් ටොන් එකක් ඇ.එ.ජ. ඩොලර් 500 මට්ටමේ පවත්වාගනු ලැබුවේ සීනි ආනයන සඳහා වටිනාකම අනුව තීරු බද්දක් පැනවීම නිසාය. එසේ වුවද, 1998 ජනවාරි මස සිට සීනි ආනයන සඳහා මෙට්‍රික් ටොන් එකකට

## 3.7 සංඛ්‍යා සටහන
## සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා

| අයිතමය | ඒකකය | හිඟුරාන සීනි කම්හල | | සෙවනගල සීනි කම්හල | | පැල්වත්ත සීනි කම්හල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1997(අ) | 1998 (ආ) | 1997 (අ) | 1998 (ආ) | 1997 (අ) | 1998 (ආ) | 1997 (අ) | 1998 (ආ) |
| 1. උක් වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය (නිරිවගාව ඇතුළුව) (ඇ) | හෙක්ටයාර | 1,679 | 916 | 3,147 | 3,157 | 4,836 | 4,470 | 9,662 | 8,543 |
| 2. උක්දඬු කපාගත් බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර | 934 | - | 2,377 | 2,422 | 4,435 | 3,928 | 7,746 | 6,350 |
| 3. කපාගත් උක්දඬු ප්‍රමාණය(ඇ) | මෙට්‍රික් ටොන් දහස් | 69 | - | 169 | 195 | 148 | 174 | 386 | 369 |
| 4. පෞද්ගලික අංශයෙන් මිලට ගත් උක්දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් දහස් | 26 | - | 2 | 2 | 361 | 358 | 389 | 360 |
| 5. අඹරන ලද උක්දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් දහස් | 95 | - | 169 | 197 | 509 | 532 | 773 | 729 |
| 6. සාමාන්‍ය ඵලදාව(ඇ) | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 73 | - | 70 | 81 | 33 | 45 | 53(ඈ) | 58 |
| 7. නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය(අපතේ යන සීනි හැර) | මෙට්‍රික් ටොන් දහස් | 6 | - | 15 | 17 | 42 | 44 | 63 | 61 |
| 8. සීනි ලබාගැනීමේ ප්‍රතිශතය(ඉ) | % | 6.20 | - | 8.76 | 8.70 | 8.34 | 8.35 | 8.15 | 8.37 |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික

(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන්ද ඇතුලත් වේ.


(ඈ) හිඟුරාන සීනි කම්හලේ දත්ත ඇතුලත් නොවේ.

(ඉ) සීනි ලබාගැනීමේ ප්‍රතිශතය $\frac{\text{නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය}}{\text{අඹරන ලද උක්දඬු ප්‍රමාණය}} \times 100$

*මූලයන්:* සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනය.
සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය.
සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය.

රුපියල් 3,500 ක් වශයෙන් නිශ්චිත බද්දක් පනවන ලදී. 1997 අවසාන භාගයේ සියයට 25 ක් වූ වටිනාකම අනුව

### 3.5 රූප සටහන
### සීනි සැපයුම




වූ බද්ද 1998 වසරේ ආනයනික සීනි වල සාමාන්‍ය මිල වූ කිලෝවකට රුපියල් 18.80 සමඟ සසඳනවිට සියයට 18 ක් පමණ විය. 1998 වසරේදී සීනි සඳහා වූ දේශීය පාරිභෝගික සාමාන්‍ය මිල සියයට 3 කින් පහත වැටුණි.

වර්තමානයේ මහා පරිමාණයේ උක් වගාව ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ (අම්පාර සහ මොනරාගල දිස්ත්‍රික්ක) කේන්ද්‍රගත වී ඇත. උක් වගා කිරීම සහ සකස් කිරීමේ කර්මාන්තය මේ ප්‍රදේශවල පදිංචි කරවන ලද පවුල් විශාල සංඛ්‍යාවකට (පවුල් 20,000 වැඩි ප්‍රමාණයක්) සෘජු සහ සෘජු නොවන රැකියා මාර්ග සලසා ඇත. එසේ වුවද, සාපේක්ෂ වශයෙන් ගත් කල අඩු අස්වැන්න, අඩු සීනි ඵලදාව සහ නිතර ඇති වන සේවක අර්බුද කර්මාන්තයට අහිතකර ලෙස බලපා ඇත. ලෝක වෙළෙඳපොළේ සීනි මිල ගණන් පහත වැටීම සීනි කර්මාන්තයේ මූල්‍යමය පැවැත්ම දුර්වල වීමේ තත්ත්වය තවදුරටත් උග්‍ර කරවීමට හේතු වී ඇත. ලෝක වෙළෙඳපොළේ සීනි මිල ගණන් පහත වැටුනත්, 1998 වසරේ රුපියලේ අගය වඩා වේගවත්ව අඩුවීම සහ ආනයනික සීනි මත පැනවූ රජයේ බදු නිසා

දේශීය සීනි මිල අඩු නොවීය. සීනි කර්මාන්තයේ මූල්‍ය පැවැත්ම තහවුරු කිරීම සඳහා කුමන හෝ රාජ්‍ය මූල්‍ය දිරි දීමක් කෙරෙන්නේ නම් එය කළහැකි වන්නේ පාරිභෝගිකයා මත තවත් බර පැටවීමෙන් පමණකි.

## 3.5 ධීවර සහ පශු නිෂ්පාදන

### ධීවර

1998 වසරේ ධීවර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 260,100 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය ඉකුත් වසරට වඩා සියයට 8 ක වැඩි වීමකි. මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය (වෙරළාසන්න, ගැඹුරු මුහුද සහ අක් වෙරළ) මෙට්‍රික් ටොන් 230,200 ක් වූ අතර එය මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 89 ක් විය. උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ධීවර නිෂ්පාදන කටයුතු වැඩි දියුණු වීම පිළිබිඹු කරමින් මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි විය. ගැඹුරු මුහුදෙහි ධීවර කටයුතු බහුදින ධීවර යාත්‍රා ඇතුළු වැඩි පහසුකම් සහ දිරි ගැන්වීම් ලබාදීම තුළින් ශක්තිමත් කිරීමද නිෂ්පාදනයෙහි වැඩි වීමට හේතු විය.

ජල ජීවී මත්ස්‍ය නිෂ්පාදනය (මිරිදිය මසුන්, කලපුවල සහ පොකුණුවල ඉස්සන් නිෂ්පාදනය) 1998 වසරේදී සියයට 11 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 29,900 ක් විය. ජල ජීවී සම්පත්වල මනා මෙහෙයුම හා කළමනාකරණයත්, මිරිදිය ජලාශවලට වැඩිපුර කුඩා මත්ස්‍ය පැටවුන් මුද හැරීමත් නිෂ්පාදනය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 1997 දී සුදු පුල්ලි රෝගයට ගොදුරු වූ ඉස්සන් වගාව 1998 වසරේදී සම්පූර්ණයෙන්ම වාගේ යථා තත්ත්වයට පත් විය. ඉස්සන් කර්මාන්තය ධීවර අංශයේ ප්‍රධානම විදේශ විනිමය ඉපැයුම් මාර්ගය බවට පත්ව ඇත. 1998 වසරේ ක්‍රියාත්මක වූ ඉස්සන් ගොවිපල සංඛ්‍යාව 970 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**3.8 සංඛ්‍යා සටහන**
**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| අනු අංශ | 1996 | 1997 (අ) | 1998 (ආ) |
|---|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 206 | 213 | 230 |
| ජල ජීවී (ඈ) | 22 | 27 | 30 |
| එකතුව | 228 | 240 | 260 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ හා ගැඹුරු මුහුදු ධීවර අංශයන්.
(ඈ) මිරිදිය මත්ස්‍ය අංශය,වෙරළබඩ කලපු ජලයෙහි ඉස්සන් සහ වගා කරන ලද ඉස්සන් නිෂ්පාදනයද ඇතුලත් වේ.

මූලය : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ඉස්සන් ඇති කරන ගොවිපල තුළ සහ ඒවායින් පිටත කළමනාකරණය දුර්වල වීම සුදු පුල්ලි රෝගය ඇති වීමට මූලික වශයෙන් හේතු විය. අළුතින් හඳුන්වා දුන් මනා ජල කළමනාකාරිත්වයත් අනෙකුත් පාලන කටයුතුත් හේතුවෙන් පසුබෑම් කිහිපයකට පසුව මෙවායේ නිෂ්පාදන කටයුතු 1998 වසරේ නැවත ආරම්භ විය. 1998 නිෂ්පාදනය මුළුමණින්ම වාගේ අපනයනය කෙරිණි. 1997 වසර හා සසඳන විට ඉස්සන් අපනයන ප්‍රමාණය සහ අපනයන ඉපැයීම් 1998 වසරේදී දෙගුණ විය. ශ්‍රී ලංකා රේගුවේ දත්තවලට අනුව 1998 වසරේ ඉස්සන් අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 6,038 ක් වූ අතර, අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 5,087 ක් විය.

ධීවර අංශය ආර්ථික ක්‍රමෝපාය අතින් රටට ඉතා වැදගත් අංශයකි. මෑත කාලයේදී මෙම අංශයේ වැදගත්කම රටේ ජනතාවට හොඳ තත්ත්වයේ මාළු ලබා දීම හා රැකියා උත්පාදනය ඔස්සේ පෙන්වා දෙනු ලැබිණි. පාරම්පරිකව ආහාර සහ පෝෂණය සඳහා දායක වන අංශයක් ලෙසද මෙම අංශය හඳුනාගෙන ඇත. මේ කාලය තුළදී ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඒ යටතේ විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ධීවර අංශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ කටයුතු හා ධීවර සම්පත්වල කළමනාකාරිත්වය විධිමත් කිරීමට ප්‍රමුඛතාවය දී තිබුණි. 1997/98 කාලය තුළ මෙම අංශය ආර්ථික කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් සිදු කරන ලදී. මෙම වෙනස්කම් ප්‍රධාන වශයෙන් චිරස්ථායි ලෙස ධීවර සම්පත් එල නෙලා ගැනීම, ධීවර නිෂ්පාදන වල තත්වය වැඩි දියුණු කිරීම සහ ධීවර කර්මාන්තයෙහි නියුක්ත වූවන්ගේ ජීවන තත්වය නගා සිටුවීම ආදිය අරමුණු කරගෙන සිදු කරන ලදී.

### පශු නිෂ්පාදන

පශු සම්පත් අංශය තුළ වඩා වැදගත් ස්ථානයක් දරන සහ හොඳින් සංවිධානය වී පවතින කුකුළු පාලන සහ කිරි නිෂ්පාදන කර්මාන්ත 1998 වර්ෂයේදී ප්‍රගතියක් පෙන්වීය. ලැබී ඇති ඇස්තමේන්තුවලට අනුව එළ කිරි නිෂ්පාදනය 1997 වූ ලීටර් දශ ලක්ෂ 252 සිට ලීටර් දශ ලක්ෂ 256 දක්වා සියයට 2 කින් වර්ධනය වී ඇත. මී කිරි නිෂ්පාදනය 1997 වූ ලීටර් දශ ලක්ෂ 79 සිට ලීටර් දශ ලක්ෂ 85 දක්වා සියයට 8 කින් වැඩි වී ඇත. සීමාසහිත කිරියා කිරි සමාගම (කලින් මිල්කෝ) ජාතික නිෂ්පාදනයෙන් වැඩිම කිරි ප්‍රමාණයක් එකතු කර ගැනීමට සමත් විය. කිරි නිෂ්පාදනයේ වැඩි වීමක් වාර්තා වුවද සීමාසහිත කිරියා සමාගම සහ සීමාසහිත නෙස්ලේ සමාගම් විසින් වර්ෂය තුළදී එකතු කරන ලද කිරි ප්‍රමාණය ලීටර් දශ ලක්ෂ 53 සහ 29 දක්වා අනු පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 15 කින් පහත වැටී ඇත. ගුණාත්මක වශයෙන් ඉහළ කිරි නිෂ්පාදනය දිරිමත් කරවීම සඳහා හොඳ තත්ත්වයේ කිරි පමණක් එකතු කිරීම මෙම පහත වැටීමට හේතු විය. කිරි නිෂ්පාදකයින් දිරි ගැන්වීම සඳහා ගුණාත්මක වශයෙන් ඉහළ කිරි සඳහා වැඩි මිලක්ද ගෙවනු ලැබිණි. උදාහරණයක් වශයෙන් සියයට 4.8 ක මේදය සහ සියයට 8.3 ක මේද නොවන ඝන ද්‍රව්‍ය අඩංගු හෝ සියයට 4 ක මේදය සහ සියයට 8.5 මේද නොවන ඝන ද්‍රව්‍ය අඩංගු කිරි සඳහා ලීටරයකට ශත 50 ක වැඩිපුර ගෙවීමක් කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ සහ ඉන්දීය කිරි සංවර්ධන මණ්ඩලයේ ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ඇරඹූ කිරියා කිරි නිෂ්පාදන සමාගම සිය ප්‍රවර්ධන කටයුතු පහළම මට්ටමේ සිට ඇරඹීය. අඩු මිලකට ගුණාත්මක වශයෙන් ඉහළ සත්ව ආහාර කිරි ගොවීන්ට ලබා දීම පිණිස සත්ව ආහාර නිෂ්පාදන ව්‍යාපෘතියක්ද මෙම සමාගම යටතේ ආරම්භ කරන ලදී. මේ අතර, පශු සම්පත් සංවර්ධන සහ වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය විසින් එතෙක් පාඩු ලබමින් තිබූ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතුද 1998 වසරේ ආරම්භ කරන ලදී. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය එහි සිටි අතිරික්ත සේවකයින්ට කැමැත්තෙන් විශ්‍රාම යාමට අවස්ථාව ලබා දුන්නේය. මණ්ඩලය යටතේ පාලනය වන සත්ව ගොවිපලවල් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය මහින් එම ගොවිපලවලට දැරීමට සිදු වූ අතිරේක වියදම් අඩු කර ගැනීමට හැකි විය.

පෞද්ගලික අංශය කුකුළු පාලන කර්මාන්තයේ ප්‍රධාන ස්ථානයක් ගන්නා අතර සුළු පරිමාණ නිෂ්පාදකයින් විශාල සංඛ්‍යාවකගෙන්ද මහා පරිමාණ නිෂ්පාදකයින් කීප දෙනෙකුගෙන්ද එය සමන්විතය. 1998 වසරේ බිත්තර නිෂ්පාදනය මිලියන 876 ක් ලෙස වාර්තා වී ඇති අතර එය පෙර වසරට වඩා සියයට 2 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. වර්ෂය පුරාම සත්ව ආහාරවල මිල නොවෙනස්ව පැවැති අතර, එයට ප්‍රධානතම හේතුව වූයේ මූලික ආහාරවල මිල ගණන් තරමක් පහත වැටීමයි. මෙම නිෂ්පාදන සඳහා ලැබුණු යහපත් මිල සහ සාමාන්‍යයෙන් ස්ථාවරව පැවැති සත්ව ආහාර මිල නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයන් දෙකොට්ඨාශයටම උපකාරී විය.

පශු සම්පත් සංවර්ධනයට ප්‍රධාන සංරෝධකයක් වන්නේ හොඳ තත්ත්වයේ ප්‍රජනන සතුන් නොමැති වීමයි. පශු සම්පත් මණ්ඩලය සතු ගොවිපලවල හොඳ තත්ත්වයේ ප්‍රජනන සතුන් (විශේෂයෙන් කිරි ගවයන් සහ ඌරන්) සංචිතයන් නොමැති නිසා බොහෝවිට සතුන් ඇති කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීමට මණ්ඩලයට නොහැකි වී ඇත. මේ තත්ත්වය මඟ හැරලීම පිණිස ඉන්දීය කිරි සංවර්ධන මණ්ඩලයේ සහයෝගිත්වය ඇතිව (කිරි ගව අවශ්‍යතා සඳහා) විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී. තවද, 1998 වර්ෂය තුළදී පශු සම්පත් සංවර්ධන සහ වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය හොඳ වර්ගයේ ප්‍රජනක සතුන් ආනයනය කිරීම සඳහා රුපියල් දශලක්ෂ 30 කට වැඩි මුදල් ප්‍රමාණයක් වැය කර ඇත.

ග්‍රාමීය අංශයේ පශු සම්පත් සංවර්ධනයට තවත් බාධකයක්ව පවතින්නේ ඉතා පහළ මට්ටමක ඇති සත්ව සෞඛ්‍ය හා ව්‍යාප්ති සේවාවයි. පශු සම්පත් සංවර්ධන සහ ව්‍යාප්ති කටයුතු ඉහළ නැංවීම සඳහා 1998 වසරේදී සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පශු වෛද්‍ය වරුන් 52 ක් අළුතින් බඳවාගෙන ග්‍රාමීය ප්‍රදේශවලට පත් කර ඇත. සත්ව සෞඛ්‍ය සහ නිෂ්පාදනය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය මෙම නිලධාරීන්ගේ වගකීමකි.

## 3.6 යෙදවුම් සහ ණය

### පොහොර

1998 වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 535,133 ක් දක්වා සියයට 5 කින් වැඩි විය. වර්ෂයේ ප්‍රථම භාගය තුළ වැඩි වූ තේ මිල ගණන්ද, යහපත් කාලගුණික තත්ත්වය සහ පොහොර සඳහා වූ විශේෂ ණය ක්‍රමයක් හඳුන්වාදීමද 1998 වර්ෂයේදී තේ වගා අංශයෙහි භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 12 කින් වැඩි වීමට හේතු විය. රබර් සඳහා වූ වෙළෙඳපොළ මිල ගණන් පහත වැටුණද, රබර් වගා අංශය වෙත නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයෙහි සියයට 33 ක වර්ධනයක් දක්නට ලැබුණි. මෙයට හේතු වූයේ රබර් නව වගාව/නැවත වගාව සඳහා සපයන ලද සහනාධාර තුළ පොහොරවල වියදමද අන්තර්ගත වීමය. සහභාගිත්ව තාක්ෂණ හුවමාරු වැඩසටහන යටතේ පොල් වගා කිරීමේ මණ්ඩලය පොල් වගාව සඳහා රසායනික පොහොර භාවිතය දිරිමත් කරන ලදී. 1998 වර්ෂයේදී අපනයන බෝග අංශය සඳහා සියයට 57 ක පමණ විශාල ප්‍රමාණයේ පොහොර නිකුත් කිරීමක් දක්නට ලැබුණි. වී වගා අංශය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයේ සුළු වැඩි වීමක් වාර්තා කළ අතර, 1998 වර්ෂය තුළදී අනිකුත් ක්ෂේත්‍ර බෝග අංශ සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය නොවෙනස්ව පැවතින.

**3.9 සංඛ්‍යා සටහන**
**බෝග අනුව පොහොර භාවිතය**

මෙට්‍රික් ටොන් දහස්

| බෝගය | 1996 | 1997(අ) | 1998(ආ) |
|---|---|---|---|
| වී | 238 | 224 | 228 |
| තේ | 154 | 162 | 182 |
| රබර් | 17 | 12 | 16 |
| පොල් | 39 | 34 | 38 |
| අනෙකුත් ක්ෂේත්‍ර බෝග | 55 | 49 | 49 |
| අනෙකුත් අපනයන බෝග | 6 | 7 | 11 |
| අනෙකුත් | 16 | 20 | 13 |
| එකතුව | 524 | 508 | 537 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලය: ජාතික පොහොර ලේකම් කාර්යාලය

1997 වර්ෂයේදී යූරියා පොහොර සඳහා පමණක් සීමා කරන ලද සංශෝධිත පොහොර සහනාධාර ක්‍රමය 1998 වර්ෂය තුළදීත් ක්‍රියාත්මක විය. ක්ෂේත්‍ර මට්ටමින් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සහයෝගය ඇතිව 1998 වර්ෂයේ ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් හඳුන්වා දෙන ලද පොහොර සඳහා වූ තත්ත්ව පාලන වැඩසටහන ක්‍රියාත්මක විය. මෙම නිලධාරීන්ට ප්‍රාදේශීය වෙළෙඳුන්ගෙන් පොහොර සාම්පල් එක්රැස් කිරීමට හා ඒවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතනවල ප්‍රාදේශීය රසායනාගාර තුළදී විශ්ලේෂණය කිරීමට බලය පවරා ඇත. වර්ෂය තුළදී දිස්ත්‍රික්ක 11 ක නිලධාරීන් මෙම කාර්යය සඳහා පුහුණු කරනු ලැබීය.

## බීජ

ජාතික බීජ ප්‍රතිපත්තියෙන් ප්‍රකාශිත පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගුණාත්මක වශයෙන් ඉහළ බීජ සහ රෝපන ද්‍රව්‍ය සැපයුම සහතික කිරීම සම්බන්ධීකරණයෙහි

**3.6 රූප සටහන**
**ප්‍රධාන බෝග වර්ගවල පොහොර යෙදවුම්**




නිරත විය. කෙසේ වෙතත් ප්‍රමාණවත් පරිදි බිත්තර වී නොමැතිවීමෙන් වී වගා අංශය මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම නිසා රජය විසින් අම්පාර, අනුරාධපුර, හම්බන්තොට, කුරුණෑගල, පොළොන්නරුව ආදී දිස්ත්‍රික්කවල බිත්තර වී නිෂ්පාදනය දියුණු කිරීම සඳහා 1999 අයවැය මගින් යෝජනා ක්‍රමයක් ප්‍රකාශයට පත් කළේය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ සූක්ෂම ඉඩම් භාවිතය මගින් සාමාන්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට විශේෂ ප්‍රතිපාදනයන් සපයනු ලැබීය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, සමුපකාර සමිති, පෞද්ගලික සමාගම් සහ ගොවි සමිති වැනි රජයේ සහ පෞද්ගලික අංශයේ සංවිධාන මගින් 1998 දී නිකුත් කල බිත්තර වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 10,965 ක් විය. මෙම ප්‍රමාණය ජාතික බිත්තර වී අවශ්‍යතාවයෙන් සියයට 9 ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් විය. ඉතිරි ප්‍රමාණය ගොවීන් විසින්ම සපයා ගත යුතු විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කරන ලද්දේ මෙම ආයතනවල බීජ නිෂ්පාදනයෙන් කොටසක් පමණකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 1998 දී නිකුත් කරන ලද අනෙකුත් ක්ෂේත්‍ර බෝග බීජ, එළවළු බීජ සහ අර්තාපල් බීජ ප්‍රමාණය පිළිවෙලින් සියයට 50, සියයට 48 සහ සියයට 2 කින් අඩු විය. රජයේ ප්‍රතිපත්තියට අනුව බීජ නිෂ්පාදනය පෞද්ගලික අංශයට පැවරීමට පියවර ගෙන ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනලද බීජ ගොවිපලවල් කිහිපයක් වාණිජමය පදනමක් යටතේ නිෂ්පාදන කටයුතු කිරීම සඳහා පෞද්ගලික අංශයට පවරන ලදී. මේ සමගම ගුණාත්මක වශයෙන් ඉහළ බීජ ද්‍රව්‍ය දේශීය නිෂ්පාදකයාට සාධාරණ මිලකට ලබා ගැනීමට හැකි වන පරිදි බීජ සහ රෝපණ ද්‍රව්‍ය ආනයනය තීරු බදු වලින් නිදහස් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික අංශය විසින් බීජ ආනයනය කිරීම 1998 දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. අර්තාපල් බීජ ආනයන මෙට්‍රික් ටොන් 1,706 දක්වා සියයට 52 කින් ඉහළ ගිය අතර, එළවළු බීජ ආනයනය මෙට්‍රික් ටොන් 186 දක්වා සියයට 26 කින් ඉහළ ගියේය. ආනයන ඉහළ ගියද, නිෂ්පාදන පිරිවැයෙහි විශාල ප්‍රතිශතයකට දායක වෙමින් බීජ අර්තාපල් මිල ඉහළ මට්ටමක පැවැතුණි.

අධික උෂ්ණත්වයට ඔරොත්තු දෙන, ඉහළ අස්වැන්න ගෙන දෙන, බැක්ටීරියා රෝගවලට ඔරොත්තු දෙන 'බී1' වර්ගය සහ ප්‍රමාණය, හැඩය සහ වර්ණය අනුව ගොවීන් ප්‍රිය කරන 'බීඑල් 355' වර්ගය වශයෙන් නව තක්කාලි ප්‍රභේදයන් 2 ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 1998 දී නිකුත් කරන ලදී. මෙයට අමතරව 1998 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පහළ මට්ටමක සීනි ප්‍රමාණයක් අඩංගු 'ගන්නෝරුව වයිට්' නම් බතල ප්‍රභේදයක්ද 'කිංයැම්' නම් අල ප්‍රභේදයක් සහ 'රීජී' නම් ඉඟුරු ප්‍රභේදයක්ද නිකුත් කිරීම සඳහා හඳුනා ගන්නා ලදී.

## කෘෂි රසායන ද්‍රව්‍ය

ලැබී ඇති තාවකාලික ඇස්තමේන්තු වලට අනුව 1998 දී කෘමිනාශක, වල් නාශක හ දිලීර නාශක ඇතුළත් මුළු කෘෂි රසායනික ද්‍රව්‍ය විකුණුම් ප්‍රමාණය සියයට 3 කින් ඉහළ ගියේය. මුළු කෘෂි රසායනික ද්‍රව්‍ය විකුණුම් ප්‍රමාණයෙන් සියයට 46 ක් පමණ වන වල් නාශක විකුණුම් මෙට්‍රික් ටොන් 2,704 දක්වා සියයට 9 කින් පහත වැටී ඇති අතර, කෘමි නාශක විකුණුම් මෙට්‍රික් ටොන් 2,582 දක්වා සියයට 20 කින් වැඩි විය. දිලීර නාශක විකුණුම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 574 දක්වා සියයට 3 කින් පහත වැටුණි.

## ණය

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) යටතේ වාණිජ බැංකු විසින් 1998 වර්ෂයේදී කෙටිකාලීන බෝග සඳහා ණය ප්‍රදානය කරන ලදී. දේශීය කෘෂිකර්මය සඳහා ණය මුදල් වැඩි වශයෙන් යොමු කිරීමේ අදහසින් රජය විසින් සපයන ලබන පොලී සහනාධාරය වර්ෂයකට සියයට 7.5 සිට සියයට 10 දක්වා වැඩි කරනු ලැබීය. කෙසේ වෙතත් නව සපිරි ණය යෝජනා ක්‍රමය යටතේ 1997/98 වගා වර්ෂය තුළ ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණය 1996/97 දී වූ රුපියල් දශ ලක්ෂ 586 සිට රුපියල් දශ ලක්ෂ 442 දක්වා පහත වැටුණි. ප්‍රදානය කල මුළු ණය අතුරින් සියයට 62 ක් එනම්, රුපියල් දශ ලක්ෂ 274 ක් 1997/98 මහ කන්නය සඳහා වූ අතර ශේෂය වූ රුපියල් දශ ලක්ෂ 168 ක මුදල 1998 යල කන්නය සඳහා ප්‍රදානය කරන ලදී. ප්‍රදානය කල මුළු ණය අතුරින් සියයට 63 ක් වී වගාව සඳහා ද ඉතිරි ප්‍රමාණය අතුරු ආහාර බෝග සඳහාද විය.

පෙර වර්ෂයේදී මෙන්ම ලංකා බැංකුව සහ මහජන බැංකුව යන රාජ්‍ය බැංකු දෙක විසින් මුළු ණය වලින් 2/3 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රදානය කර තිබිණ. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ප්‍රදානය කල ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 82 දක්වා සියයට 8 කින් පහත වැටුණු අතර, එය වගා වර්ෂය තුළ ප්‍රදානය කල මුළු ණය වලින් සියයට 19 ක් විය. 1998 යල කන්නය තුළදී නව සපිරි ග්‍රාමීය ණය සඳහා වන පොලිය වාර්ෂිකව සියයට 16 සිට සියයට 12 දක්වා අඩු කරනු ලැබීය.

## 3.7 වන සම්පත්

වන සංරක්ෂණ සහ පාරිසරික අමාත්‍යාංශය සංරක්ෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ප්‍රතිපත්ති විමර්ශණය සහ සම්පාදනය, දිගුකාලීන ආංශික සැලසුම්කරණය, නීතිමය කටයුතු විමර්ශණය සහ සම්පාදනය, ආංශික කටයුතු පිළිබඳ පරීක්ෂාව සහ සම්බන්ධීකරණය, වන සම්පත් හා ඒ හා සම්බන්ධ කටයුතු සඳහා ආධාර දෙන ආයතනවලට සහාය වීම ආදී කටයුතු වැඩි කිරීම සහ දැඩි නීති රීති ක්‍රියාත්මක කිරීම මගින් නීති විරෝධී වනාන්තර විනාශ කිරීම් පාලනය කිරීම තවදුරටත් ඉටුකරනු ලැබීය.

පරිසර කළමනාකරණ ව්‍යාපෘති කිහිපයක් 1998 දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. නෝර්වීජියානු සංවර්ධන වැඩසටහන (නොරාඩ්) මගින් රුපියල් දශ ලක්ෂ 3.9 ක විදේශ ආධාර මුදලක් සිංහරාජ සහ නකල්ස් සංරක්ෂණ ව්‍යාපෘති සඳහා යොදවා ඇත. රුපියල් දශ ලක්ෂයක මුදලක් කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා යොදවා ඇත. සංරක්ෂක ප්‍රදේශ කළමනාකරණය, සංචිත කලාප කළමනාකරණය, ව්‍යාප්ති සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන්, ගොඩනැගිලි නඩත්තුව, මාවත් ඉදි කිරීම් හා නඩත්තුව ආදී කටයුතු මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. 'සහභාගිත්ව වන සංරක්ෂණ ව්‍යාපෘතිය' සඳහා ආසියානු සංවර්ධන බැංකුව හා ඕස්ට්‍රේලියානු ආධාර වැඩසටහන මගින් රුපියල් දශ ලක්ෂ 248.5 ක් ලබා දී තිබේ. මෙම අරමුදල් මුළුමනින්ම වාගේ දැනට භාවිතා කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ 1998 දී පැල දශ ලක්ෂ 10.5 ක් නිෂ්පාදනය කර ඇති අතර

**3.10 සංඛ්‍යා සටහන**
**වන සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1996 | 1997(අ) | 1998(ආ) |
|---|---|---|---|---|
| 1. මුළු වනාන්තර ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර දහස් | 2,119 | 2,119 | 2,119 |
| සන වනාන්තර (ඈ) | හෙක්ටයාර දහස් | 1,583 | 1,583 | 1,583 |
| ලඳු කැළෑ | හෙක්ටයාර දහස් | 464 | 464 | 464 |
| කඩොලාන | හෙක්ටයාර | 8,687 | 8,687 | 8,687 |
| 2. එළි කරන ලද වන බිම් ප්‍රමාණය (ඉ) | හෙක්ටයාර | 300 | 205 | 210 |
| 3. නැවත වන වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර | 13,167 | 205(ඊ) | 571 |
| 4. වාර්තා වූ වන නීති උල්ලංඝනය කිරීම් | සංඛ්‍යාව | 5,014 | 5,158 | 4,193 |
| දැව ප්‍රමාණය | ඝන මීටර | 3,918 | 2,488 | 2,589 |
| දැව වටිනාකම | රුපියල් දශලක්ෂ | 35.7 | 29.5 | 29.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) දළ වශයෙන් හෙක්ටයාර 72,350 ක ප්‍රයෝජනයට ගතහැකි වන වගාද අයත් වේ.
(ඈ) කඩොලාන ඇතුලත් වේ.
(ඉ) ඇස්තමේන්තු කළ
(ඊ) සහභාගිත්ව වන වගා ව්‍යාපෘති යටතේ ඇති වනාන්තර වපසරිය ඇතුලත් නොවේ.

මූලය: වන සම්පත් දෙපාර්තමේන්තුව

වල තවදුරටත් නිරත විය. 1998 දී දැව සැපයුම සඳහා කපන ලද වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 210 ක් විය. වර්ෂය තුලදී හෙක්ටයාර 571 ක බිම් ප්‍රමාණයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත වගා කරන ලදී.

වන නීති උල්ලංඝනය කිරීම 1997 දී වාර්තා වූ 5,158 සිට 1998 දී 4,193 දක්වා සියයට 19 කින් අඩු විය. කෙසේ වෙතත් අල්ලා ගන්නා ලද නීති විරෝධීව කපන ලද දැව ප්‍රමාණය ඝන මීටර 2,589 ක් වූ අතර පසුගිය වසර හා සැසඳීමේදී එය සියයට 4 කින් වැඩි වී ඇත. එහි වටිනාකමද රුපියල් දශ ලක්ෂ 30 ක් වශයෙන් සුළු වැඩිවීමක් පෙන්වයි. දැව ප්‍රවාහනය කිරීමේදී පරීක්ෂාවට ලක් කිරීමේ අවස්ථා පහත සඳහන් වන වගාවන්ද කරන ලදී. එනම් ගෙවතු වගා සංවර්ධනය (හෙක්ටයාර 7,392), ගොවි වන වගා කටයුතු (හෙක්ටයාර 2,540), ආරක්ෂිත වන වගා කට්ටි (හෙක්ටයාර 1,141) සහ විවිධ අරමුණු සඳහා කරනු ලැබූ වෘක්ෂ රෝපණ වැඩසටහන් (හෙක්ටයාර 591 හා කිලෝ මීටර් 464 ක මංමාවත්වල වෘක්ෂ රෝපණය)

වන සම්පත් දෙපාර්තමේන්තුව වර්ෂය තුළදී ජාතික වන සම්පත් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමෙහි නියැලුනු අතර වන සම්පත් අංශයේ පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් ලබා ගැනීමට ආයෝජන ව්‍යාපෘති සකස් කිරීමේ කටයුතුවලද නිරත විය.